# වාර්ෂික වාර්තාව
# 2018

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

# ජාතික අධ්‍යාපන ආයතනය

# කළමනාකරණ මණ්ඩලය

ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර මහත්මිය

**අධ්‍යක්ෂ ජනරාල්**

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**

**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

කේ.ඩබ්ලිව්.බී.එම්.පී. විජේසුන්දර මහතා

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**

**පාලන, මුදල් හා සහාය සේවා**

එන්.වී.ඒ.එස්. සමරසිංහ මහතා

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)**

**ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය**

# ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ මණ්ඩලය

ඩී.ඒ. ජයලාල් මහතා
අධ්‍යක්ෂ
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

ආර්.එම්.පී.සී. රණසිංහ මහතා
අධ්‍යක්ෂ
විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව

ජේ.ඩී. ප්‍රේමචන්ද්‍ර මහතා
අධ්‍යක්ෂ
සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව

කේ.ආර්. පත්මසිරි මහතා
අධ්‍යක්ෂ
ගණිත දෙපාර්තමේන්තුව

ආචාර්ය එස්.ඒ.ඩී. සමරවීර මහතා
අධ්‍යක්ෂ
ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තුව

ආචාර්ය වී.ඩී.සී.පී. පෙරේරා මහත්මිය
අධ්‍යක්ෂ
බාහිර සම්පත් කළමනාකරණ අංශය

එන්.ටී.කේ. ලොකුලියන මහතා
අධ්‍යක්ෂ
තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව

එම්.පී.ආර්. ධනවර්ධන මහත්මිය
අධ්‍යක්ෂ
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

ඒ.කේ.ඒ.ආර්. අලහකෝන් මහත්මිය
අධ්‍යක්ෂ
ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව

ටී. මාලනී මහත්මිය
අධ්‍යක්ෂ
මුදල් දෙපාර්තමේන්තුව

එම්.ආර්.ඩබ්ලිව්. මද්දුම
අධ්‍යක්ෂ
සිංහල භාෂා දෙපාර්තමේන්තුව

ජී.එච්. අශෝකා මහත්මිය
අධ්‍යක්ෂ
සම්භාව්‍ය භාෂා, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පටුන

**1 කොටස : ප්‍රගති වාර්තාව**

**1.0 හැඳින්වීම**

1.1 ආයතනයේ අරමුණු

1.2 මූලාසකරණය

1.3 කාර්ය මණ්ඩල පත්කිරීම

**2.00 ජාතික අධ්‍යාපන ආයතනයේ සංවිධානාත්මක ව්‍යුහය**

2.1 2017 පාලක සභාව

2.2 පීඨ සහ ශාඛා

2.2.1 භාෂා, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය

2.2.2 විද්‍යා හා තාක්ෂණ පීඨය

2.2.3 පර්යේෂණ සහ සැලසුම් පීඨය

2.2.4 අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය

2.2.5 ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය

2.2.6 පාලන, මුදල් හා සහාය සේවා අංශය

**3.0 විෂයමාලා සංවර්ධන**

3.1 ප්‍රාථමික අධ්‍යාපනයට අදාළ ඉටුකළ කාර්යය

3.2 ද්විතීය අධ්‍යාපනයට අදාළ ඉටුකළ කාර්යය

3.3 දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම

**4.0 අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණය**

**5.0 ගුරු වෘත්තීය සංවර්ධනය**

5.1 සංවර්ධන

**6.0 විකල්ප අධ්‍යාපනය**

6.1 අන්තර්කරණ අධ්‍යාපනය

6.2 විද්‍යුත් ප්‍රචාරණය

6.3 මාර්ගෝපදේශනය සහ උපදේශනය

6.4 විවෘත ඉගෙනුම

**7.0 පර්යේෂණ හා සැලසුම්**

7.1 පර්යේෂණ හා සංවර්ධනය

7.2 සැලසුම් හා ඇගයුම්

**8.0 පාලන, මුදල් හා සහාය සේවා**

8.1 පරිපාලන දෙපාර්තමේන්තුව

8.2 මුදල් දෙපාර්තමේන්තුව

8.3 ඉංජිනේරු සේවා හා නඩත්තු දෙපාර්තමේන්තුව

8.4 පුස්තකාලය

8.5 මුද්‍රණ හා ප්‍රකාශන

**2 කොටස : විගණකාධිපති වාර්තාව**

**3 කොටස : මුදල් ප්‍රකාශය පිළිබඳ පැහැදිලි කිරීමේ වාර්තාව**

**4 කොටස : මුදල් ප්‍රකාශ පිළිබඳ සටහන්**

# වාර්ෂික ප්‍රගති වාර්තාව - 2018

## 1.0 හැඳින්වීම

### 1.1 ආයතනයේ අරමුණු

1985 අංක 28 දරණ පාර්ලිමේන්තු පනත මගින් දූයේ දරුවනට ගුණාත්මක අධ්‍යාපනයක් උරුම කර දීම සඳහා ඉවහල් වන පහත සඳහන් අරමුණු ඉටුකරලීමේ බලය ජාතික අධ්‍යාපන ආයතනයට පවරා ඇත.

(අ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා වූ සැලසුම්, වැඩ සටහන් සහ ක්‍රියාකාරකම් පිළිබඳව විෂයභාර අමාත්‍යවරයාට උපදෙස් දීම;

(ආ) අධ්‍යාපනය හා අදාළ විශේෂිත ක්ෂේත්‍ර සඳහා පශ්චාත් උපාධි අධ්‍යාපනය සැලසීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම.

(ඇ) අධ්‍යාපන පද්ධතියෙහි කාර්ය සාධනය, අරමුණු, ව්‍යුහ, අන්තර්ගතය සහ විධි ක්‍රම ද ඇතුළුව අධ්‍යාපන ක්‍රමය පිළිබඳව සහ අධ්‍යාපනයේ සමාජ, ආර්ථික සහ වෙනත් අංශ අනාවරණය කර ගැනීම සඳහා අධ්‍යයන පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඈ) අධ්‍යාපනික කාර්ය සඳහා තාක්ෂණික ඥානය අනුවර්තනය කිරීම ද ඇතුළුව අධ්‍යාපන පද්ධතියේ නවීකරණ ක්‍රියාවලි ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඉ) අධ්‍යාපන පද්ධතියෙහි නියැළි කාර්ය මණ්ඩලවල වෘත්තීය සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඊ) රජයට සහ වෙනත් අනුමත සංවිධාන සඳහා අධ්‍යාපනය හා සම්බන්ධ විශේෂඥ සේවා ලබාදීම;

(උ) විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් අධ්‍යාපන සංවර්ධනය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ

(ඌ) සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමග සහයෝගීව කටයුතු කිරීම.

ඒ අනුව දේශීය හා ගෝලීය අවශ්‍යතාවලට සරිලන, සමාජ ආර්ථික සංදර්භයට උචිත, චිර භාවිත දේශීය දැනුම් හා උරුම අගයන ඵලදායී පුරවැසියන් බිහි කිරීම සඳහා ඉවහල් වන විෂයමාලාවක් මගින් අධ්‍යාපනයේ ගුණාත්මක බව සහතික කිරීමේ ද, පාසල් පද්ධතියට අවශ්‍ය නිපුණතා පූර්ණ වෘත්තිකයන් පිරිසක් නිර්මාණය කරනු සඳහා නායකත්වය සැපයීමේ ද, අධ්‍යාපන සංවර්ධනය ඉලක්ක කර ගත් ප්‍රතිපත්ති සම්පාදනය සුසාධ්‍ය කිරීමට හා ඊට මග පෙන්වනු පිණිස විද්‍යාත්මක විධි ක්‍රම ඔස්සේ තහවුරු කරගත් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමේ ද වගකීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරී ඇත. ඒ අනුව ජාතික අධ්‍යාපන ආයතනයට පැවරී ඇති කාර්යභාරය පීඨ පහක් සහ එක් අංශයක් මගින් ක්‍රියාවට නංවනු ලැබේ.

කාලයේ වේගය ඉක්මවා විවිධ ඉගෙනුම් ක්ෂේත්‍ර තුළට එකතුවන නව දැනුම ජාතියේ දරුවනට උරුම කර දීම සඳහා ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක විෂයමාලා ප්‍රතිපත්තියට අනුව සෑම අවුරුදු 8කට වරක් ම

විෂයමාලා නවීකරණ ක්‍රියාවලියක් සිදු කෙරේ. ඒ අනුව පසුගිය විෂයමාලා සංවර්ධන ක්‍රියාවලිය 2006 වර්ෂයෙන් ආරම්භ වී 2010 වසරේ දී සාර්ථකව නිම කරන ලදී. පාසල් විෂයමාලාව අරභයා 2012 වසරේ දී තබන ලද ස්ථාවර පදනම මත පිහිටා 2015 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජිත නව විෂයමාලාව සඳහා පවත්නා විෂයමාලාව විචාරවත් විෂයමාලාවක් බවට පත් කිරීමේ කටයුතු 2012 වසරේ දී ආරම්භ කරන ලදි. පවත්නා විෂයමාලාව යථාර්තවත් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් පාදක කරගනු ලැබුවේ පහත සඳහන් අංශ විෂයමාලාව හා බද්ධ කිරීම සඳහාය.

1. විෂයමාලාව පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වීම පිළිබඳව ඒ ඒ විෂය කංඩායම් මගින් ක්‍රියාත්මක කරන ලද අධ්‍යයන වලින් අනාවරණය වු කරුණු;
2. විෂයමාලාව පිළිබඳව විවිධ සමාජ කණ්ඩායම් මගින් පෙන්වා දෙන ලද ධනාත්මක අදහස් හා යෝජනා;
3. විෂයමාලා සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව ලෝකයේ විවිධ රටවල්වල සාර්ථක අත්දැකීම්;
4. ඒ ඒ විෂය ක්ෂේත්‍රවලට එක්වූ නව දැනුම් හා ඉගෙනුම් ක්‍රමවේද;

2018 වර්ෂයේ දී ප්‍රධාන වශයෙන් විෂයමාලා කාර්ය නාභිගත කරන ලද්දේ 3,9 හා 13 ශ්‍රේණිවල යාවත්කාලීන විෂයමාලාව පන්ති කාමරයේ ක්‍රියාත්මක වීම සුපරික්ෂණය සහ 2019 වසරේ දී ක්‍රියාත්මකවීමට නියමිත 4 ශ්‍රේණිය ගුරු අත්පොත් සකස් කිරීම හා පළාත් පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහාය.

### 1.2 මූල්‍ය තත්ත්වය

අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන හඳුන්වා දීමෙන් අනතුරුව විෂයමාලා සංවර්ධනය හා සම්බන්ධ කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ප්‍රධාන වශයෙන් ආවරණය කර ගන්නා ලද්දේ වර්තමානයේ "දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය" (TSEP /DFAT) යනුවෙන් හැඳින්වෙන අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන (ESDFP) හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) හා ආසියානු සංවර්ධන බැංකු (ADB) ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP) යන මූල්‍ය ප්‍රවාහ යටතේය.

වගුව 1: 2018 වර්ෂයේ ආයතනයේ ආදායම් වියදම් පිළිබඳ තොරතුරු

| මූල්‍ය ප්‍රභවය | පුනරාවර්තන වියදම් | | ප්‍රාග්ධන වියදම් | |
|---|---|---|---|---|
| | සංශෝධිත ප්‍රතිපාදනය | සත්‍ය වියදම | සංශෝධිත ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
| ඒකාබද්ධ අරමුදල (CF) | 430,000,000 | 411,000,000 | 200,000,000 | 103,960,960 |
| දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසල් අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කිරීම පිළිබඳ ව්‍යාපෘතිය (TSEP) සහ ඕස්ට්‍රේලියානු රජයේ ප්‍රතිපාදන (DFAT) | 13,285,000 | 13,285,000 | 11,715,000 | 11,715,000 |
| ආයතනයේ ආදායම් (Income) | 273,896,000 | 273,896,000 | 142,600,000 | 79 , 744 , 215 |
| අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩ සටහන (ESDP) | 92,000,000 | 86,865,000 | - | - |
| එක්සත් ජාතීන්ගේ ළමා සංවර්ධන අරමුදල (UNICEF) | 17,684,000 | 11,268,529 | - | |
| අධ්‍යාපන අමාත්‍යාංශය (MoE) | 159,000,000 | 159,000,000 | 85,000,000 | 74,657,111 |
| යුනෙස්කෝව සඳහා වූ කොරියානු ජාතික කොමිසම | 3,814,000 | 3,907,000 | - | - |

## 1.3 කාර්ය මණ්ඩලය

පාර්ලිමේන්තු පනත මගින් ආයතනයට පැවරී ඇති කාර්ය ඉටුකිරීමට අමතරව අධ්‍යාපනය හා සම්බන්ධව රජය විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන, පාසල් පාදක ඇගයීම් වැඩසටහන වැනි ප්‍රමුඛ වැඩ සටහන්වල තිරණාත්මක කාර්යභාරයක් ජාතික අධ්‍යාපන ආයතනයට පැවරී තිබුණු අතර, විශාල කාර්යමණ්ඩල හිඟයක් පවතිද්දී වුවද විවිධ බාධක වලට ද මුහුණ දෙමින් යථෝක්ත කාර්ය ඉටුකිරීම සඳහා දැඩි කැපවීමක් කිරීමට 2018 වසරේ දී සිදු විය.

වගුව 2 : 2018 වසර අවසාන වනවිට ආයතනයේ පැවති කාර්යමණ්ඩල තත්ත්වය

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය (01.01.2018 දිනට) | පවත්නා කාර්ය මණ්ඩලය (31.12.2018 දිනට) | | | පුරප්පාඩු සංඛ්‍යාව (31.12.2018 දිනට) |
|---|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | |
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 00 | 01 | 01 | 00 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | 00 | 01 | 00 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 06 | 02 | 00 | 02 | 04 |
| අධ්‍යක්ෂ | 27 | 08 | 05 | 13 | 14 |
| සහා ලේකම් (අධ්‍යාපන) | 01 | 01 | 00 | 00 | 01 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ | 72 | 33 | 29 | 62 | 10 |
| කථිකාචාර්ය / අධ්‍යාපනඥ | 75 | 07 | 16 | 23 | 52 |
| සහකාර කථිකාචාර්ය/සහකාර අධ්‍යාපනඥ | 90 | 28 | 30 | 58 | 32 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 379 | 135 | 138 | 273 | 106 |
| **එකතුව** | **652** | **214** | **219** | **433** | **219** |

ආයතනයේ කාර්ය මණ්ඩල හිඟය පියවීමට ජාතික අධ්‍යාපන ආයතනය විසින් අධ්‍යාපන අමාත්‍යාංශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ එක්ව ගත් උත්සාහයන්හි ප්‍රතිඵලයක් ලෙස කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව ආයතනයේ තනතුරු කිහිපයක පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු ආයතනයේ කළමනාකරණය විසින් ගන්නා ලද අතර 2019 වර්ෂයේ දී ඉතිරි පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

**වගුව 3 : අධ්‍යාපන සුදුසුකම් අනුව අධ්‍යයන කාර්යමණ්ඩලය**



## 2.0 ජාතික අධ්‍යාපන ආයතන සංවිධාන ව්‍යූහය

### 2.1 ආයතන සභාව - 2018

ජාතික අධ්‍යාපන ආයතන පනත මගින් එහි ආයතන සභාව වෙත පහත සඳහන් බලතල පැවරී ඇත:

- ව්‍යවස්ථාවෙන් නියම කරන ලද බඳවා ගැනීමේ පටිපාටි හා පත් කිරීම් සම්බන්ධ ක්‍රියා පිළිවෙලට අනුව ආයතනයේ කාර්යමණ්ඩලය පත් කිරීම;
- ආයතනයේ කාර්ය මණ්ඩලයේ සේවා සම්බන්ධ නියමයන් සහ කොන්දේසි, වැටුප්, වේතන හා අනෙකුත් පාරිතෝෂික ඇතුළු කාර්යමණ්ඩල සේවා ගෙවීම් සම්බන්ධ නීති රීති තිරණය කිරීම;
- ආයතනයේ විනය සම්බන්ධ නීති රීති සම්පාදනය කිරීම;
- ආයතන කාර්යමණ්ඩලයට ප්‍රතිලාභ ලැබෙන පරිදි හා අර්ථ සාධක සහ සුභසාධක වැනි අරමුදල් ස්ථාපිත කිරීම හා විධිමත් කිරීම.

ජාතික අධ්‍යාපන ආයතන පනතට අනුව ආයතනය සම්බන්ධ මූල්‍ය හා පරිපාලන බලතල පැවරී ඇත්තේ ආයතන සභාවට ය. 2018 වසරේ ආයතන සභාව පහත සඳහන් සාමාජික සාමාජිකාවන්ගෙන් සමන්විත විය.

| | | |
|---|---|---|
| *සුනිල් හෙට්ටිආරච්චි මහතා* | - | *සභාපති* |
| *(ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය)* | | *(2018.10.30 දක්වා)* |
| *පද්මසිරි ජයමාන්න මහතා* | - | *සභාපති* |
| *(ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය)* | | *(2018.10.31 සිට)* |
| *ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර මහත්මිය* | - | *සාමාජික* |
| *(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)* | | |
| *තිස්ස හේවාවිතාරණ මහතා* | - | *සාමාජික* |
| *(රාජ්‍ය ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය)* | | |
| *එස්.එච්. කුමාරසිංහ මහතා* | - | *සාමාජික* |
| *(විදුහල්පති (විශ්‍රාමික) රාජකීය විදුහල, කොළඹ 07)* | | |
| *මහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න මහතා* | - | *සාමාජික* |
| *(උප සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව)* | | |
| *ආචාර්ය හේමමාලා රත්වත්ත මහත්මිය* | - | *සාමාජික* |
| *(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයන දෙපාර්තමේන්තුව, විවෘත විශ්ව විද්‍යාලය)* | | |
| *එම්.කේ. ප්‍රදීප් කුමාර මහතා* | - | *සාමාජික* |
| *(අධ්‍යක්ෂ, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපා., මුදල් අමාත්‍යංශය)* | | |

*ඒ.එම්.ආර්.බී. අමරකෝන් මහතා - සාමාජික*
*(කොමසාරිස් ජෙනරාල් (විශ්‍රාමික) විභාග දෙපාර්තමේන්තුව)*
*ආචාර්ය හර්ෂ සුබසිංහ මහතා - සාමාජික*
*මහාචාර්ය පී. රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා - සාමාජික*
*(සභාපති, අන්තරායකර ඖෂධ නිවාරණ ජාතික මණ්ඩලය)*
*එම්.එම්. ක්‍රිෂාන්ති මහත්මිය - සාමාජික*
*(අධ්‍යක්ෂ, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ඒකකය) -*
*එම්.ඒ.පි. මුණසිංහ මයා - ආයතන සභා ලේකම් (2018.10.31 දක්වා)*
*(විශ්‍රාමික ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි, ජා.අ.ආ)*
*ආචාර්ය වී.සි.ඩී.පී.පෙරේරා මහත්මිය - ආයතන සභා ලේකම් (2018.12.31 සිට)*
*(අධ්‍යක්ෂ, බාහිර සම්පත් කළමනාකරණ ඒකකය, ජා.අ.ආ)*

## 2.2 ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය - 2018

ආයතන සභාවට අමතර ව ආයතනයේ සියලු ම ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධයෙන් උපදෙස් දීමට අධ්‍යාපන, කළමනාකරණ, පරිපාලන හා වෙනත් ක්ෂේත්‍රවල ප්‍රවීණත්වයක් ඇති විද්වතුන්ගෙන් සමන්විත ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයක් පත් වන අතර, එමගින් ආයතනයේ පහත දැක්වෙන ශාස්ත්‍රීය කාර්ය හා සම්බන්ධයෙන් අධ්‍යාපනික නායකත්වය, සුපරීක්ෂණය සහ උපදේශනය ලබා දෙයි.

- සියලු ම ශාස්ත්‍රීය කාර්යවල දී ආයතන සභාවට උපදෙස් සැපයීම;
- ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධ ව ආයතන සභාව විසින් පවරන ලද කටයුතු සම්බන්ධයෙන් කරුණු සමාලෝචනය කොට වාර්තා කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා, පුහුණු වැඩසටහන් සහ විභාග පිළිබඳ නිර්දේශ ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යාපන පාඨමාලා, පුහුණු වැඩසටහන් හා විභාග සඳහා සිසුන් බඳවා ගැනීම පිළිබඳ නිර්දේශ ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා, පුහුණු වැඩසටහන් හෝ විභාගවලට අදාළ නීති රීති සම්පාදනය කිරීම හා ඒවා ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග පරීක්ෂකවරුන් වශයෙන් පත් කිරීමට සුදුසු අයගේ නම් ආයතන සභාවට නිර්දේශ කිරීම;
- ආයතන සභාව මඟින් අනුමත කොන්දේසි සම්පූර්ණ කරන ලද පුද්ගලයන් සඳහා ශිෂ්‍යත්ව, පදක්කම් සහ ත්‍යාග ප්‍රදානය කිරීම හා
- ආයතන සභාවේ අනුමැතිය ඇතිව විවිධ කමිටු සඳහා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඇතුළත් වන අය මෙන්ම ඉන් පරිබාහිර පුද්ගලයන් පත් කිරීම;

2018 වසරේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය සමන්විත වූයේ පහත දැක්වෙන විද්වතුන්ගෙනි.

| | | |
|---|---|---|
| *ආචාර්ය එම්.ඒ. උපාලි මාම්පිටිය මහතා* | - | *සභාපති* |
| *(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගණිත දෙපාර්තමේන්තුව, කැලණිය විශ්ව විද්‍යාලය)* | | *(2018 ජූනි දක්වා)* |
| *මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතා* | - | *සභාපති (2018.09.17 සිට)* |
| *(මහාචාර්ය (විශ්‍රාමික) දේශපාලන විද්‍යා දෙපා. කොළඹ විශ්ව විද්‍යාලය)* | | |
| *ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර මහත්මිය* | - | *සාමාජික* |
| *(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)* | | |
| *මහාචාර්ය ආර්. අරංගල මහතා* | - | *සාමාජික* |
| *(සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)* | | |
| *කේ.එම්.එච්.බණ්ඩාර මහතා* | - | *සාමාජික* |
| *(ප්‍රධාන කොමසාරිස්, ගුරු අධ්‍යාපන, අධ්‍යාපන අමාත්‍යංශය)* | | |
| *ඊ.කේ. ගණිහිගම මහතා* | - | *සාමාජික* |
| *(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික) සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය )* | | |
| *මහාචාර්ය ආර්. යූ. හල්වතුර මහතා* | - | *සාමාජික* |
| *(සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, මොරටුව විශ්ව විද්‍යාලය)* | | |
| *ඩබ්ලිව්.ඩී.පී. නාලිකා මහත්මිය* | - | *සාමාජික* |
| *(කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපා., අධ්‍යාපන අමාත්‍යංශය)* | | |
| *ආචාර්ය එම්.ටී.එම්. මහීස් මහතා* | - | *සාමාජික* |
| *(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්ව විද්‍යාලය)* | | |
| *ආචාර්ය මහීම් මෙන්ඩිස් මහතා* | - | *සාමාජික* |
| *(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව විවෘත විශ්ව විද්‍යාලය)* | | |
| *වී. මුතුකුමාරස්වාමි මහතා* | - | *සාමාජික* |
| *(හිටපු විදුහල්පති, හින්දු විද්‍යාලය කොළඹ 04)* | | |
| *බී. සනත් පූජිත මහතා* | - | *සාමාජික (2017 නොවැම්බර් සිට)* |
| *(විභාග කොමසාරිස් ජනරාල්, විභාග දොපර්තමේන්තුව)* | | |
| *ආචාර්ය ප්‍රසාද් විමලරත්න මහතා* | - | *සාමාජික* |
| *( ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පරිගණක පාසල, කොළඹ විශ්ව විද්‍යාලය)* | | |
| *ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර මහතා* | - | *සාමාජික* |
| *(ලේකම්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව)* | | |

*පූජ්‍ය ආචාර්ය මාබුල්ගොඩ සුමනරතන ස්වාමින් වහන්සේ - සාමාජික*
*(නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ජා.අ.ආ.)*
*එන්.වි.ඒ.එස්. සමරසිංහ මහතා - සාමාජික*
*(වැඩ බලන, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය ජා.අ.ආ.)*
*එම්.ඒ.පී. මුණසිංහ මහතා - ශාස්ත්‍රීය කටයුතු ලේකම් (2018.10.31 දක්වා)*
*(විශ්‍රාමික ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි, ජා.අ.ආ)*
*ආචාර්ය වී.සී.ඩී.පී. පෙරේරා මහත්මිය - ශාස්ත්‍රීය කටයුතු ලේකම් (2018.12.31 සිට)*
*(අධ්‍යක්ෂ, බාහිර සම්පත් කළමනාකරණ ඒකකය, ජා.අ.ආ)*

අධ්‍යයන සභාවේ සහ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ උපදේශනය හා අධීක්ෂණය යටතේ ජාතික අධ්‍යාපන ආයතනයට පැවරුණු කටයුතු පහත සඳහන් සංවිධාන ව්‍යුහය යටතේ ක්‍රියාත්මක කරන ලදි.

## 2.3 අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය, විභාග දෙපාර්තමේන්තුව, බාහිර සම්පත් කළමනාකරණ ඒකකය හා අභ්‍යන්තර විගණන අංශය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. ආයතනයේ ආයතන සභාව සහ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට අවශ්‍ය ලිපි ලේඛන සකස් කිරීම, බෙදා හැරීම, අදාළ වාර්තා පවත්වාගෙන යාම මෙන්ම ආයතන සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ තිරණ අදාළ පීඨ හා අංශවලට දැනුම් දීමත් අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්ලයේ වගකීම් වේ. පසුගිය වසරේ දී ආයතන සභා රැස්වීම් 12ක් සහ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල රැස්වීම් 13ක් පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු ඉටුකොට ඇත.

ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන විවිධ පාඨමාලාවල ඇගයීම් කටයුතු මනාලෙස ඉටුකරගැනීම සඳහා කාර්යක්ෂම හා ඵලදායී තක්සේරු ක්‍රමයක් පවත්වාගෙන යාම විභාග දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධාන වගකීමයි. පහත සඳහන් පාඨමාලා හා සම්බන්ධ විභාග පැවැත්වීම, ඇගයීම සහ සහතික නිකුත් කිරීම 2018 වසරේ දී ඉටු කොට ඇත.

- ගණිතය ඉගැන්වීම පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව - (පුනර් පරීක්ෂණය)
- ගණිතය ඉගැන්වීම පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ ප්‍රවේශ විභාගය 2018
- බ්‍රේල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - 2018 (අවසාන විභාගය)
- පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව -2017 /2018 (අවසාන විභාගය)
- අතිරේක භාෂා සංවර්ධන ඩිප්ලෝමාව - 2017 / 2018
- විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2018 (අවසාන විභාගය)
- සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව - 2017 / 2018 (අවසාන විභාගය)

- උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2017 /2018 (අවසාන විභාගය)
- පාසල් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2016 / 2017 (සෙමෙස්තර 1 විභාගය)
- දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2018
- අධ්‍යාපනවේදී උපාධිය - 2011/2013 (තුන්වන කොටස) - පුනර් පරීක්ෂණ
- අධ්‍යාපනවේදී උපාධිය - 2013 /2015 (තුන් වන කොටස) - පුනර් පරීක්ෂණ
- අධ්‍යාපනපති උපාධිය (ප්‍රවේශ විභාගය) - 2019 /2020
- අධ්‍යාපන විද්‍යාපති උපාධිය අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණ 2018 (විදේශීය)
- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2013/2014 (පුනර් පරීක්ෂණය)
- පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ පාඨමාලාව - 2018 (සෙමෙස්තර 1 විභාගය)
- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016 (පුනර් පරීක්ෂණය)
- කාර්යක්ෂමතා කඩඉම් විභාගය (අනධ්‍යයන කාර්ය මණ්ඩල ජා.අ.ආ)
- කාර්යක්ෂමතා කඩඉම් විභාගය අධ්‍යන කාර්යමණ්ඩලයේ AR1 සහ AR2 සඳහා

**2018 වර්ෂයේ දී පැවැත් වූ අතිරේක විභාග පහත දක්වේ.**

- ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 111 වන පන්තියේ නිලධාරීන් දිශාභිමුඛ කිරීමේ වැඩසටහන අවසානයේ පැවති විභාගය 2018

ආයතනයේ ප්‍රධානියා වන අධ්‍යක්ෂ ජනරාල්වරයා සමග සෘජුව සම්බන්ධ වෙමින් ආයතනයේ අභ්‍යන්තර පරිපාලන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය මගින් කාර්යක්ෂම විගණන සේවාවක් පවත්වා ගෙන යයි. ඒ අනුව විගණනය සම්බන්ධ විගණන වාර්තා 22 ක් සැකසීම සහ විවිධ දෙපාර්තමේන්තුවලින් ඉදිරිපත් කරන ලද රු. 75,000 ට වැඩි වැඩමුළු ඇස්තමේන්තු 361ක ගෙවීම් පරීක්ෂා කරන ලදී.

ආයතනයට උපරිම ප්‍රතිලාභ ලබාගනු පිණිස දේශීය හා විදේශීය නියෝජිත ආයතන සහ විදේශ ව්‍යාපෘති සම්බන්ධ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම බාහිර සබඳතා ඒකකයේ ප්‍රධාන වගකීම වේ. මීට අමතරව කාර්ය මණ්ඩලයට විදේශ ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්ව ලබා දීම ද ඒකකයේ කාර්යයකි. පසුගිය අවුරුදු පහක කාලය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ඉවහල් වන දිර්ඝකාලීන හා කෙටිකාලීන විදේශීය පාඨමාලා රැසක් සඳහා අවස්ථාව සම්පාදනය කරදෙන ලදී.

- 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහනේ විෂයමාලා සංවර්ධන කාර්යවල නියුක්ත නිලධාරීන් 18 දෙනෙක් දින 07ක පුහුණු වැඩසටහනක් සඳහා මැලේසියාවට යැවීම.

- නිලධාරීන් 4 දෙනෙකු සඳහා පරීක්ෂණ හා ඇගයීම් සම්බන්ධ නිපුණතා සංවර්ධන වැඩ සටහනකට මැලේසියාවට යාමට අවස්ථාව ලබා දීම.
- අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 9 දෙනෙකු මැලේසියාවේ Science Management විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය උපාධිය සම්පූර්ණ කිරීම.
- බාහිර සම්පත් කළමනාකරණ ඒකකය මගින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව, ආයතනයේ නිලධාරීන් 31 දෙනෙකු සඳහා විදේශ වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගීවීමට අවස්ථා සම්පාදනය කිරීම.

### 2.4 පීඨ / අංශ

2018 වර්ෂයෙහි ආයතනයේ සංවිධාන ව්‍යූහය පහත සඳහන් එක් එක් පීඨ සහ අංශ යටතේ ක්‍රියාත්මක විය.

#### 2.4.1 භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
දෙමළ භාෂා දෙපාර්තමේන්තුව
ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තුව
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ආගම් හා සාරධර්ම දෙපාර්තමේන්තුව
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

#### 2.4.2 විද්‍යා හා තාක්ෂණ පීඨය

විද්‍යා දෙපාර්තමේන්තුව
ගණිත දෙපාර්තමේන්තුව
තාක්ෂණික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වාණිජ දෙපාර්තමේන්තුව
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව
සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන ඒකකය
මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව

#### 2.4.3 පර්යේෂණ, සැලසුම් හා සංවර්ධන පීඨය

සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව
පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව

#### 2.4.4 අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය

වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ දෙපාර්තමේන්තුව
අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන දෙපාර්තමේන්තුව
විදේශීය පාඨමාලා ඒකකය

### 2.4.5 ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය

ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව

අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සම්භාව්‍ය, විදේශීය භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව

මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය

විවෘත පාසල් ඒකකය

### 2.4.6 පරිපාලන, මූල්‍ය හා සහාය සේවා අංශය

පරිපාලන හා මානව සම්පත් දෙපාර්තමේන්තුව

මුදල් දෙපාර්තමේන්තුව

ඉංජිනේරු හා නඩත්තු සේවා දෙපාර්තමේන්තුව

පුස්තකාල හා කෞතුකාගාර දෙපාර්තමේන්තුව

ප්‍රවාහන ඒකකය

### 2018 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ කාර්ය

විෂයමාලා සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ අධ්‍යාපන පර්යේෂණ සම්බන්ධයෙන් 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් වූ කරුණු වලට අමතරව 2018 වාර්ෂික සැලැස්මේ ඇතුළත් නොවූ එහෙත් එම කාර්ය හා සම්බන්ධ අතිරේක ක්‍රියාකාරකම් රැසක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2018 වර්ෂයේ දී ඉටු කර ඇත.

- ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන උපාධි පාඨමාලා / පශ්චාත් උපාධි පාඨමාලා සාර්ථකව නිමකරනු ලැබූ උපාධි ලාභින් සඳහා වූ උපාධි ප්‍රධානෝත්සවය 2018 මාර්තු 28 වන දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වීම. එහි දී ගරු අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතා සහ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ගරු රාධක්‍රිෂ්ණන් මහතා විසින් අධ්‍යාපන දර්ශනපති උපාධිලාභියකු, අධ්‍යාපනපති උපාධිලාභින් 334 දෙනෙකු, අධ්‍යාපන විද්‍යාපති උපාධිලාභින් 3 දෙනෙකු සහ අධ්‍යාපනවේදී උපාධිලාභින් 1669 දෙනෙකු සඳහා උපාධි සහතිකපත්‍ර ප්‍රදානය කිරීම.
- ආයතනය සඳහා අවශ්‍ය දේශනාගාර පහසුකම්, තාක්ෂණික, විද්‍යා සහ ගණිත විද්‍යාගාර පහසුකම් මෙන්ම නවීන ශ්‍රවණාගාරයකින් සමන්විත පස්මහල් ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම.
- ආයතනයේ ආපනශාලාව නවීන ගෘහ භාණ්ඩ සහ මුළුතැන්ගෙයි උපකරණ සහිතව නවීකරණය කිරීම.

- "අග්‍රහාර" රක්ෂණ ක්‍රමය ආයතනයට හඳුන්වාදීම සහ එහි දී උපරිම ප්‍රතිලාභ ආයතනයේ කාර්ය මණ්ඩලයට ලබාදෙනු පිණිස එම රක්ෂණයේ මාසික වරිකයෙන් භාගයක් ආයතනයේ ආදායමින් දැරීමට කටයුතු කිරීම.
- ආයතනයේ මහරගම පරිශ්‍රයේ ප්‍රධාන පිවිසුම් මාර්ගය සහ සියළු අතුරු මාර්ග බිම්ගල් ඇතිරීම සහ කාපට් යොදා අළුත් වැඩියා කිරීම.
- ජාතික අධ්‍යාපන ආයතනයේ විවෘත පාසල් ඒකකය විසින් මෙතෙක් කරගෙන ආ වැඩපිළිවෙළ වෙනුවෙන් යුනේස්කෝ අනුග්‍රහයෙන් පිරිනැමෙන ආසියා හා පැසිපික් කලාපීය අධ්‍යාපන නව්‍යතා සම්මානය දිනා ගැනීම.

## 3.0 විෂයමාලා සංවර්ධනය

ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සංවර්ධන කටයුතු ඉටු කරනු ලබන්නේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සහ විද්‍යා හා තාක්ෂණ යන පීඨ මගිනි.

විෂයමාලා සම්පාදනය සඳහා ආයතනයට පැවරී ඇති බලතල යටතේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයට අයත් දොපර්තමේන්තු 7ක්, විද්‍යා තාක්ෂණ පීඨයට අයත් දෙපාර්තමේන්තු 5ක් හා ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨයට අයත් සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව ද ඇතුළත්ව 2018 වර්ෂයේ දී විෂයමාලා සංවර්ධනය හා සම්බන්ධ ව්‍යාපෘති 75ක් ක්‍රියාත්මක කරන ලදී. විෂයමාලා සංවර්ධන කාර්ය තුළින් පහත සඳහන් ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කළ අතර, යම් යම් බාධක මධ්‍යයේ වුව ද එම අපේක්ෂා වැඩි ප්‍රමාණයක් ලඟ කර ගැනීමට ජාතික අධ්‍යාපන ආයතනය සමත් වී ඇත.

- සමාජ, සංස්කෘතික, ආර්ථික සහ තාක්ෂණික අවශ්‍යතාවලට ගැළපෙන පරිදි විෂයමාලා සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, පුනරීක්ෂණ සහ සංශෝධන කටයුතු කිරීම.
- විෂයමාලා නවීකරණ හා සමග ම අර්ථවත් ප්‍රායෝගික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා වන නව විධික්‍රම පාසල් පද්ධතියට හඳුන්වා දීම.
- විෂයමාලා සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීමේ කාර්යවල නියුක්ත පිරිස්වල වෘත්තීය නිපුණතා වැඩි දියුණු කිරීම.
- විෂයමාලා සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම යන ක්ෂේත්‍රවල තොරතුරු අනාවරණය කර ගැනීම සඳහාත් අධ්‍යාපනයේ ගුණාත්මක ප්‍රවර්ධනය සඳහාත් ඉවහල් වන පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ හා ඇගයීම් ක්‍රියාමාර්ගවල සාර්ථකත්වය සඳහා නව විධික්‍රම හඳුන්වා දීම.

- ශිෂ්‍යයන්ගේ සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ නිපුණතා සහ ජාතික හා ජාත්‍යන්තර භාෂා නිපුණතා සංවර්ධනය කිරීම.

- සංස්කෘතික හා ස්වාභාවික උරුමය රැක ගැනීමේ සහ ආරක්ෂා කර ගැනීමේ නිපුණතා සිසුන් තුළ ඇති කිරීම.

- සමාජයේ ජීවත් වන විවිධ ජන කණ්ඩායම්වලට ආවේණික ආගමික, සංස්කෘතික හා භාෂාමය වශයෙන් පවත්නා විවිධත්වය අගය කිරීමටත් ශ්‍රී ලාංකිකයන් ලෙස සැම දෙනාට ම එක් ව සිටීමටත් අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම.

පහත දැක්වෙන විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව යථාවත් විෂයමාලාව පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වීම 2015 වර්ෂයේ දී ආරම්භ වූ අතර, එහි ඊ ළඟ පියවර 2019 වසරේ දී 4 ශ්‍රේණියේ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විෂයමාලා සංවර්ධන හා පුහුණු කටයුතු 2018 වසරේ දී ඉටුකරන ලදී.

**වගුව 4 : 2012 - 2020 විෂයමාලා චක්‍රය සඳහා වන විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම**

| කාර්යය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|---|---|
| විෂයමාලා ව්‍යාප්ති සටහන් සැකසීම (Grid) | 1-5 6-11 ශ්‍රේණි | | | | | | | | |
| විෂය නිර්දේශ සකස් කිරීම | 6,10 ශ්‍රේණි | 1,7,11 ශ්‍රේණි | 2,8 ශ්‍රේණි | 3,9,12 හා 13 ශ්‍රේණි | 4 ශ්‍රේණි | 5 ශ්‍රේණි | | | |
| ගුරු අත්පොත් සැකසීම | | 6,10 ශ්‍රේණි | 1,7,11 ශ්‍රේණි | 2,8,12 ශ්‍රේණි | 3,9,13 ශ්‍රේණි | 4 ශ්‍රේණි | 5 ශ්‍රේණි | | |
| දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම | | | 6,10 ශ්‍රේණි | 1,7,11 ශ්‍රේණි | 2,8,12 ශ්‍රේණි | 3,9,13 ශ්‍රේණි | 4 ශ්‍රේණි | 5 ශ්‍රේණි | |
| විෂයමාලාව ක්‍රියාත්මක කිරීම | | | | 6,10 ශ්‍රේණි | 1,7,11 ශ්‍රේණි | 2,8,12 ශ්‍රේණි | 3,9,13 ශ්‍රේණි | 4 ශ්‍රේණි | 5 ශ්‍රේණි |

**විෂයමාලා සංවර්ධනය වෙනුවෙන් 2018 වර්ෂයේ දී නිම කළ විෂයමාලා කාර්ය පහත දැක්වේ.**

3.1 ප්‍රාථමික අධ්‍යාපනයට අදාළව නිම කළ කාර්ය

- 4වන ශ්‍රේණියට අදාළව ගුරු මාර්ගෝපදේශ 12ක් සකස් කර ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ හා ආයතන සභාවේ අනුමැතිය ලබාගැනීම.
- 5 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය සැලසුම් ගත ක්‍රීඩා හා ක්‍රියාකාරකම් අන්තර්ගත කොට කෙටුම්පත් කිරීම.

- ප්‍රාථමික අධ්‍යාපනයේ දෙවන ප්‍රධාන අවධිය සඳහා හඳුනාගත් අදාළව අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවලට අදාළව විශේෂ ගුරු අත්පොතක් සකස් කිරීම.
- ප්‍රාථමික අධ්‍යාපනයේ දෙවන ප්‍රධාන අවධිය සඳහා හඳුනාගත් ක්‍රියාකාරකම් පාදක කරගත් වාචික ඉංග්‍රීසි ශක්තිමත් කිරීමට අතිරේක ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කිරීම.
- පූර්ව ළමාවිය සංවර්ධන ප්‍රමිති (වසය අවු. 10) සකස් කිරීමට අදාළව කරන ලද අධ්‍යයනයේ දත්ත රැස්කර අවසන් කිරීම හා දත්ත විශ්ලේෂණ කටයුතු ආරම්භ කිරීම.
- පළාත් බද නිලධාරීන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් 2ක් පැවැත්වීම සහ 2වන ශ්‍රේණියට අදාළව ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය සම්බන්ධ වාර්තාවක් සකස් කිරීම.
- පළමු ප්‍රධාන අවධියට අදාළව සාමාජීය හා චිත්තවේග සංකල්ප සවිමත් කිරීමට අවශ්‍ය අතිරේක අත්පොත සඳහා ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම.
- අපදා අවදානම් අවම කිරීම, කාලගුණ වෙනස් වීම, පාසල තුළ ආරාක්ෂාව, නිර්මාණශීලී ගැටළු විසඳීම සහ සමාජ එකාබද්ධතාව යන සංකල්ප ප්‍රාථමික අධ්‍යාපනය තුළට අන්තර්ගහනය කිරීම සඳහා ගණිතය හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්වලට අදාළව සකස් කළ ක්‍රියාකාරකම් පද්ධතියේ අත්හදා බැලීම.
- ප්‍රාථමික අධ්‍යාපනය තුළ සමාජ ඒකාබද්ධතා සංකල්ප ශක්තිමත් කිරීමට 2වන ජාතික භාෂාව ඉගැන්වීමට අදාළ කතන්දර පොතක් සහ ඩී.වී.ඩී. තැටියක් නිර්මාණය කිරිමට අදාළ පිටපත් කෙටුම්පත් කිරීම.
- පළාත් ප්‍රාථමික අධ්‍යාපන සම්පත් පුද්ගල කණ්ඩායම්වල සාමාජිකයන් 1050 දෙනෙකු සඳහා ප්‍රාථමික විෂයමාලාව පිළිබඳ ශක්‍යතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

### 3.2 ද්විතීයික අධ්‍යාපනයට අදාළ ව නිම කළ කාර්ය

- ඊළග විෂයමාලා චක්‍රය ආරම්භ කිරීම සඳහා විෂයමාලා ව්‍යාප්ති සටහන් (Curriculum Gride) සඳහා පාදක කරගැනීමේ අපේක්ෂාවෙන් ක්‍රියාත්මක කරන ලද ගැඹුරු අධ්‍යයනයන්හි අනාවරණ ඉදිරිපත් කිරීම සහ ඊට අදාළ වාර්තා සැකසීම.
- යථාවත් විෂමාලාව පිළිබඳව 6-11 ශ්‍රේණිවල ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂවරුන් 2333 දෙනෙකු සහ 12 /13 ශ්‍රේණිවල ගුරුවරුන් 18,595 දෙනෙකු පුහුණු කිරීම.
- රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව සහ ඉංජිනේරු තාක්ෂණවේදය යන විෂය සඳහා ප්‍රායෝගික අත්පොත් සකස් කිරීම.
- ගණිතය සහ තොරතුරු තාක්ෂණය සඳහා උසස් පෙළ සම්පත් පොත් 03ක් සැකසීම සහ උසස් පෙළ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව සඳහා සකස් කළ සම්පත් පොත්වල අවසන් කෙටුම්පත් සංස්කරණය කිරීම.
- උසස් පෙළ ඉතිහාසය සිතියම් පොත දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම.

- උසස් පෙළ ව්‍යාපාර සංඛ්‍යානය සඳහා ශිෂ්‍ය පරීක්ෂණ අයිතම සකස් කර අවසන් කිරීම හා උසස් පෙළ ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණ විෂය සඳහා ශිෂ්‍ය පරීක්ෂණ අයිතම සකස් කිරීම.
- 6 වන ශ්‍රේණියේ තෝරාගත් පාඩම් සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් ගණිතය ඉගැන්වීම සඳහා අදාළ සංකල්ප රාමුව සකස් කර අවසන් කිරීම.
- දෙවන ජාතික භාෂාව සිංහල (6 ශ්‍රේණිය) වැඩ පොතක් සකස්කිරීම.
- වෘත්තීය අධ්‍යාපනය (වැඩ ලෝකය) පිළිබඳ අත්පොතක් සකස් කිරීම.
- ඉගෙනුම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට 6-13 ශ්‍රේණිවල විවිධ විෂය සඳහා අධ්‍යාපන මෘදුකාංග 25ක් සකස් කිරීම.
- ඉංග්‍රිසි භාෂා තක්සේරුකරණය පිළිබඳ 05 වන ජාතික සම්මන්ත්‍රණය ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තුව විසින් පැවැත්වීම.
- සංගීත අධ්‍යාපනය තුළින් සාමාජ ඒකාබද්ධතාව වර්ධනය කිරිමට ඩී.වී.ඩී. තැටියක් (පිටපත් 500ක් සමඟ) නිෂ්පාදනය කිරීම.

**පුහුණු වැඩසටහන් පැවැත්වීම**

| ශ්‍රේණිය | 2018 සඳහා ඉලක්කය | 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා පුහුණු වූ ගුරුවරු සංඛ්‍යාව |
|---|---|---|
| 6-11 ශ්‍රේණි | 2,010 | 1,991 |
| 12 / 13 ශ්‍රේණි | 18,140 | 18,174 |

**විශේෂ දැනුවත් කිරිමේ වැඩසටහන්**

- ගෝලීය පුරවැසිභාවය පිළිබඳ ගුරු උපදේශකවරුන් සහ විෂය අධ්‍යක්ෂවරුන් 204 දෙනෙකු දැනුම්වත් කිරීම.
- ගුරුවරුන් 580 දෙනෙකු සඳහා සංයුක්ත ගණිතය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ගුරුවරුන් 500 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව අධ්‍යයනය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

**පාසල් පාදක ඇගයීම**

- 6-9 ශ්‍රේණිවල පළමු වාරය සඳහා පාසල් පාදක කරගත් ඇගයීම් උපකරණ 26ක් සකස් කර අවසන් කිරීම සහ දෙවන හා තුන්වන වාර සඳහා ඇගයීම් උපකරණ සැකසීම ආරම්භ කිරීම.

- පාසල් පාදක ඇගයීම සම්බන්ධ උපදේශාත්මක අත්පොතක් කෙටුම්පත් කර එය අධ්‍යාපන අමාත්‍යාංශය හා විභාග දෙපාර්තමේන්තුව වෙත යෝජනා හා අදහස් සඳහා ඉදිරිපත් කිරීම.
- 2019 පළාත් මට්ටමින් පාසල් පාදක ඇගයීම සම්බන්ධයෙන් පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහා වැඩ සැලැස්මක් සකස් කිරීම.

### 3.3 දහතුන් වසරක සහතික කළ අධ්‍යාපන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම

ජතික අධ්‍යාපන ආයතනය ආරම්භයේ සිට අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි විෂයමාලා සංවර්ධන කාර්ය හා සම්බන්ධව අවස්ථා කිපයක දී විවිධ අත්හදා බැලිම්, සංවර්ධන උපායමාර්ග ක්‍රියාත්මක කරනු ලැබුව ද පළමු ශ්‍රේණියට ඇතුළත් වන දරුවන් අතරින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගය දක්වා වූ වසර දහයක පාසල් අධ්‍යාපන කාලය අතරතුර දී මෙන් ම අවසානයේ දී විශාල ප්‍රතිශතයක ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉගෙනුම් සමාජයෙන් ඉවත් වෙයි. නූතන ලෝකයේ සාර්ථක පුරවැසියකු සේ ජිවත්වීමට අවශ්‍ය දැනුමක්, නිපුණතාවක් හෝ ශක්‍යතාවක් උරුම කර නොගෙන මෙසේ විශාල පිරිසකට සමාජයට එක්වීමට මග පැදි ඇත්තේ පවත්නා දෘඩි ව්‍යුහගත විෂයමාලාව සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද භාවිතය හා ඇගයීම් ක්‍රමවේදවල පවත්නා ගැටළු සහගත තත්ත්ව හේතුවෙනි.

අධ්‍යාපන පද්ධතියෙහි පවත්නා මෙම පරතරය මෙන්ම ගෝලීය හා දේශීය වශයෙන් අධ්‍යාපනයෙහි ගොඩනැගී ඇති නැම්යා හා දිශානතීන් මෙන්ම නව ප්‍රවණතා හඳුනාගත් රජය දරුවන්හට සාර්ථක ඵලදායි අධ්‍යාපනයක් ලබා දීම සඳහාත් නිදහස් අධ්‍යාපන සංකල්පය රට තුළ යථාර්ථයක් බවට පත්කිරීම සඳහාත් දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩ සටහන නමින් නව අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනාව හඳුන්වා දෙන ලදී.

ඒ හා සම්බන්ධිත විෂයමාලා සංවර්ධන කාර්ය හා පුහුණු කටයුතු 2016 වසරේ අගභාගයේ දී ජාතික අධ්‍යාපන ආයතනයට පැවරුණු අතර, එම වැඩ සටහනේ පොදු විෂය සංරචකයට අදාළ විෂය ක්ෂේත්‍ර 8ක් සඳහා විෂය නිර්දේශ හා මොඩියුල සකස් කිරීමත් විෂය කාණ්ඩ 7 යටතේ ක්‍රියාත්මක වන නව වෘත්තීය විෂය 26ක් සඳහා විෂයමාලා හා මොඩියුල සකස් කිරීම 2017 වසර තුළ ජාතික අධ්‍යාපන ආයතනය විසින් ඉටු කරන ලදී.

ඊට අමතරව මෙම වැඩසටහන දෙවන අදියර යටතේ පාසල් 154ක ක්‍රියාත්මක කිරීම මෙන්ම පහත සඳහන් කාර්ය 2018 වසරේ දී ආයතනය විසින් ඉටු කොට ඇත.

- දෙවන අදියර යටතේ තෝරාගත් පාසල් 154හි විදුහල්පතිවරුන් සහ පාසල් සම්බන්ධීකරණ නිලධාරින් 278ක් පුහුණු කිරීම.
- එම තෝරාගත් පාසල් 154න් නම්කරන ලද ගුරුවරුන් 1378 දෙනෙකු වෘත්තීය විෂය 26 සඳහා පුහුණු කිරීම.
- අලුතින් බඳවාගත් නවක උපාධිධාරී ගුරුවරුන් 898 දෙනෙකු සඳහා පූර්ව සේවා ගුරුපුහුණු වැඩසටහනක් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 07ක දී 2018.08.06 සිට 2018.08.24 දින දක්වා පැවැත්වීම හා එම ගුරුවරුන් ට විෂය මූලික ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් 2018.08.27 සිට 2018.09.05 දක්වා අදාළ ආයතනවල දී පැවැත්වීම.

- වෘත්තීය විෂය සංරචකයට ඇතුළත් විෂය 26 සඳහා දෙවන මොඩියුල (අන්තර් මාධ්‍ය) සකස් කිරීම.
- දෙවන අදියර යටතේ වෘත්තීය විෂය සංරචකය පාසල් වල ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරුන් 760ක් (අලුතින් බඳවාගත් හා පද්ධතියේ දැනට සිටින) පුහුණු කිරීම.

## 4.0 අධ්‍යාපන නායකත්ව සංවර්ධනය හා වෘත්තීය සංවර්ධන අවස්ථා වැඩිදියුණු කිරීම

අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ගේ වෘත්තීය සංවර්ධනය වැඩිදියුණු කිරීම මීපේ පිහිටුවා ඇති අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨයට පැවරී ඇති ප්‍රධාන කාර්යයයි. යථෝක්ත කාර්යය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන කළමනාකරණ සංවර්ධන පීඨය මගින් අධ්‍යාපන විද්‍යාපති කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාවේ සිට අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව දක්වා පවත්වයි. 2018 වර්ෂයේ ඉටු කළ විශේෂිත කාර්ය පහත සඳහන් වෙයි.

- කළමනාකරණ පුවත් සඟරාව හා අධ්‍යාපන කළමනාකරණ සඟරාව සකස් කිරීම.
- පාසල් නායකත්වය පිළිබඳ ජාතික නිපුණතා රාමුවට අදාළව මොඩියුල 40ක් සකස් කිරීම හා එය පදනම් කරගෙන පුහුණුකරුවන් 105ක් හා කලාප අධ්‍යාපන නිලධාරින් 29 දෙනෙකු පුහුණු කිරීම.
- පාසල් නායකත්වය පිළිබඳ ජාතික නිපුණතා රාමුව පිළිබඳ පළාත් නිලධාරින් 1500 දෙනෙකු දැනුවත් කිරීම.

2018 වසරේ දී පවත්වන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු වගුවේ සඳහන් වේ.

**වගුව 5 : වෘත්තීය සංවර්ධන පාඨමාලා පිළිබඳ විස්තර - 2018**

| පාඨමාලාව | වගකීම දරන දෙපාර්තමේන්තුව | පාඨමාලාව පැවැත්වෙන ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| **පශ්චාත් උපාධි පාඨමාලා**<br>අධ්‍යාපන කළමනාකරණ විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව | වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 34 |
| **පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා**<br>පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා (පූර්ණකාලීන යන අර්ධකාලීන පාඨමාලාව) | වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 293 |
| **ඩිප්ලෝමා පාඨමාලා**<br>පාසල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 261 |
| **විදේශීය සිසුන් සඳහා වන පාඨමාලා**<br>අධ්‍යාපන නායකත්ව සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව | වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 15 |

## 5.0 ගුරුවරුන් සඳහා වෘත්තීය සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

අධ්‍යාපන පද්ධතියෙහි නියැළි වෘත්තිකයින් සඳහා ඔවුන්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා පාදක කර ගනිමින් විශාල පරිමාණයෙන් විවිධ ගුරු කණ්ඩායම් සඳහා නවීකරණ හා විධික්‍රම හඳුන්වාදීමේ දීර්ඝකාලීන අත්දැකීම් රාශියක් ජාතික අධ්‍යාපන ආයතනය ලබා ගෙන ඇත. පද්ධතියට හඳුන්වා දෙනු ලබන විෂයමාලා සංවර්ධන හෝ වෙනත් ඕනෑම සංවර්ධනාත්මක කාර්යයක සාර්ථකත්වය රඳා පවතින්නේ ඒවා ක්‍රියාත්මක කරනු ලබන ගුරුවරුන් සතුව ඒ පිළිබඳව මනා අවබෝධයක් හා දැනුවත් බවක් ඇත්නම් පමණි. ඔවුන් ඵලදායී ක්‍රියාකාරීන් කිරීම සඳහා ඉවහල් වන අධ්‍යාපන දර්ශනපති පාඨමාලාවේ සිට සහතික පත්‍ර පාඨමාලා දක්වා පැතිරුණු පාඨමාලා රැසක් ගුරු අධ්‍යාපනය හා සම්බන්ධ දෙපාර්තමේන්තු සහ විෂයමාලා සංවර්ධන දෙපාර්තමේන්තු කීපයක් විසින් දිවයින පුරා විහිදුණු ප්‍රාදේශීය මධ්‍යස්ථාන රැසක් ද කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබයි.

ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන පාඨමාලා ප්‍රධාන වශයෙන් නාභිගත කොට ඇත්තේ අධ්‍යාපන වෘත්තිකයන්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා ඉටු කිරීම සහ පහත සඳහන් අරමුණු ඉටු කර ගතහැකි ගෞරවණීය ගුරු පිරිසක් බිහි කිරීමේ අපේක්ෂා පෙරදැරි කර ගනිමිනි.

- අධ්‍යාපනයේ නව දිශානතීන් හඳුනාගැනීමට සමත්කම් දක්වන;
- පුළුල් විෂය දැනුම සහ එය පංති කාමරය තුළ මනා ලෙස භාවිත කිරීමට සමත්;
- ඉගැන්වීමේ සහ පංති කාමර කළමනාකරණ කුසලතා උසස් මට්ටමින් සංවර්ධනය කර ගත හැකි;
- සිසුන්ගේ පෞද්ගලික විවිධතාවලට ගැලපෙන අයුරින් ඵලදායී වැඩ සැලසුම් කළ හැකි;
- දෙමව්පියන්ගේ දැනුම හා ශක්‍යතා හා හැකියා ඵලදායී ලෙස ලබාගැනීමට වැඩ සැලසුම් කළ හැකි;
- හොඳ ඉගැන්වීමක් සඳහා අවශ්‍ය පොදු නිපුණතා ගොඩනංවා ගතහැකි;
- කාර්යබද්ධ පුහුණුව සංවර්ධනය කර ගැනීමට ඉවහල්වන කුඩා පරිමාණයේ පර්යේෂණවල නියැළෙන;
- නිපුණතා පාදක කාර්යසාධනය සඳහා පුහුණුව ලබාගන්නා සහ
- ඉගැන්වීම සඳහා ස්වයං නිර්මාණී එළඹුමක් සංවර්ධනය කර ගත හැකි;

පහත වගුව ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ විවිධ දෙපාර්තමේන්තු විසින් සහ ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය විසින් 2018 වසරේ දී පවත්වන ලද පාඨමාලා සහ එහි සහභාගිත්වය පෙන්නුම් කරයි.

වගුව 6 : ගුරු අධ්‍යාපන පාඨමාලා පිළිබඳ තොරතුරු - 2017

| පාඨමාලාව | වගකීම දරන දෙපාර්තමේන්තුව | පාඨමාලාව පැවැත්වෙන ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| **පශ්චාත් උපාධි පාඨමාලා** | | | |
| අධ්‍යාපන දර්ශනපති පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ. | 26 |
| අධ්‍යාපනපති පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ./යාපනය | 311 |
| **පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා** | | | |
| පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ /ප්‍රාදේශීය මධ්‍යස්ථාන 24 | 3600 |
| **උපාධි පාඨමාලා** | | | |
| අධ්‍යාපනවේදී ගෞරව උපාධි පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ/මධ්‍යස්ථාන 01 | 1015 |
| අධ්‍යාපනවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ./මධ්‍යස්ථාන 37 | 3860 |
| අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (ඉංජිනේරු තාක්ෂණවේදය) | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ මධ්‍යස්ථාන 04 | 200 |
| **ඩිප්ලෝමා පාඨමාලා** | | | |
| දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | ජා.අ.ආ | 22 |
| පූර්ව ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව | ප්‍රාථමික අධ්‍යාපනය | ජා.අ.ආ | 35 |
| විශේෂ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | අන්තර්කරණ අධ්‍යාපන | ජා.අ.ආ. | 63 |
| සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව | අන්තර්කරණ අධ්‍යාපන | ජා.අ.ආ | 27 |
| උපදේශනය හා මාර්ගෝපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | උපදේශන හා මාර්ගෝපදේශන ඒකකය | ජා.අ.ආ. | 72 |
| අතිරේක භාෂා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ./මධ්‍යස්ථාන 10 | 352 |
| **සහතික පත්‍ර පාඨමාලා** | | | |
| බ්‍රේල් පාඨමාලාව | අන්තර්කරණ අධ්‍යාපන | ජා.අ.ආ | 15 |
| ගණිතය ඉගැන්වීම පිළිබඳ පාඨමාලාව | ගණිත | ජා.අ.ආ | 70 |

## 5.1 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල හා ගුරු විද්‍යාලවල ගුණාත්මක සංවර්ධනය

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හරහා පූර්ව සේවා ගුරු අධ්‍යාපන විෂයමාලා ක්‍රියාත්මක කිරීම මෙන්ම ගුරු මධ්‍යස්ථාන හරහා සේවාස්ථ ගුරු අධ්‍යාපනය සංවර්ධනය කිරීමත් ජාතික අධ්‍යාපන ආයතනයට අයත් වගකීමකි. ඒ අනුව 2018 වසර තුළ පහත දැක්වෙන කාර්ය පූර්ව සේවා හා සේවාස්ථ ගුරු පුහුණුවට අදාළව ජාතික අධ්‍යාපන ආයතනය විසින් ඉටුකර ඇත.

- ක්‍රියාමූලික පර්යේෂණ පිළිබඳ සම්මන්ත්‍රණයක් පැවැත්වීම හා පර්යේෂණ වාර්තා 40ක් ඇගයීම.

- ගුරු විද්‍යාලවල සාමාන්‍ය විෂයමාලාවේ අභ්‍යන්තර පරීක්ෂණ 02ක් සඳහා සිංහල හා දෙමළ මාධ්‍යවලින් ප්‍රශ්න පත්‍ර 30ක් සැකසීම.
- විද්‍යාපීඨ හා ගුරු විද්‍යාලවල උප පීඨාධිපතිවරුන්ට අධ්‍යයන සැසි 05ක් පැවැත්වීම.
- විද්‍යාපීඨ හා ගුරු විද්‍යාවල ක්‍රියාත්මක වන ගුරු අධ්‍යාපන පාඨමාලා නියාමනය හා සුපරීක්ෂණය සඳහා අවස්ථා 5ක දී කටයුතු කිරීම.
- අධ්‍යාපන විද්‍යා පීඨවල ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා කෙටුම්පතක් සකස් කිරීම.
- ගුරු විද්‍යාලවල ප්‍රධාන විෂය ධාරාව යටතේ විශේෂ විෂය සහ වෘත්තීය විෂයවලට අදාළ විෂය නිර්දේශ 61 ක අවසාන කෙටුම්පත් හා විෂය 7ක මුල් කෙටුම්පත් සැකසීම.
- ශ්‍රී ලංකා ගුරු සේවයට ඇතුළත් වීමට අවශ්‍ය මූලික සුදුසුකම් ලබා ගැනීමට නුපුහුණු ගුරුවරුන් 1000 දෙනෙකු සඳහා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පුහුණු අත්පොත ගුරු අධ්‍යාපනඥයන්ගේ භාවිතය සඳහා පරිවර්තනය කිරීම සහ දේශීයකරණය කිරීම.

## 6.0 විකල්ප අධ්‍යාපනය

විවිධ හේතූන් මත විධිමත් අධ්‍යාපන අවස්ථා අහිමි වූ දරුවන් සඳහා අධ්‍යාපන අවස්ථා හිමි කර දීම සඳහා ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය විශේෂ අවධානයක් යොමුකර කටයුතු කරයි. ඒ අනුව සැමට අධ්‍යාපනය සහ යාවජීව අධ්‍යාපනය යන සංකල්ප සාර්ථක කර ගැනීම සඳහා නවීන තාක්ෂණය හා උපස්තම්භක සේවා ලබා දෙමින් විකල්ප අධ්‍යාපන පීඨය යටතේ ක්‍රියාත්මක වන අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව හා මාර්ගෝපදේශන හා උපදේශන අංශය මගින් 2018 වර්ෂය තුළ ඉටු කළ කාර්ය පහත සඳහන් වෙයි.

## 6.1 අන්තර්කරණ අධ්‍යාපනය

" සැමට අධ්‍යාපනය" යන සංකල්පය යථාර්ථයක් බවට පත් කර ගැනීමේ දී අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට විශේෂ ස්ථානයක් හිමිවේ. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා යෝග්‍ය වන පරිදි විෂයමාලාව සංවර්ධනය කිරීම, විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ට හා ගුරු උපදේශකවරුන් සඳහා අවශ්‍ය පුහුණු කටයුතු සිදුකිරීම හා අතිරේක විෂයමාලා ද්‍රව්‍ය සම්පාදනය වැනි කාර්යවල වගකීම පැවරී ඇත්තේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුවටය. ඊට අමතරව මෙම දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා, සංඥා භාෂා ඩිප්ලෝමා ආදි පාඨමාලා ඔස්සේ අන්තර්කරණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළි ගුරුවරුන්ට වෘත්තීය සංවර්ධන අවස්ථා සම්පාදනය කෙරේ. අදාළ කාලපරිච්ඡේදය තුළ උක්ත දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම සහ එය පද්ධතිය තුළ සිටින කොටස්කරුවන්ට හඳුන්වා දීම.
- සංගීත විෂය සඳහා බ්‍රේල් අධ්‍යාපන මාර්ගෝපදේශ ග්‍රන්ථයක් සකස් කිරීම සහ ඒ පිළිබඳව ගුරුවරුන් 35 දෙනෙකුට පුහුණුව ලබාදීම.
- අන්තර්කරණ අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා අතිරේක විෂයමාලා ග්‍රන්ථයක් සම්පාදනය කිරීම. (විවිධ දුබලතා සහිත දරුවන් සඳහා)
- විශේෂ අවශ්‍යතා සහිත දරුවන් 35 දෙනෙකු හඳුනාගෙන, එම දරුවන් සමඟ කටයුතු කරන දෙමාපියන් සඳහා උපදේශන සේවා ආරම්භ කිරීම.
- විශේෂ අධ්‍යාපන සඟරාව එළිදැක්වීම.
- අන්තර්කරණ අධ්‍යාපන ක්ෂේත්‍ර හා සම්බන්ධ ගුරු උපදේශවරු හා ගුරුවරුන් 172 දෙනෙකු පුහුණු කිරීම.

## 6.2 විද්‍යුත් ප්‍රචාරණය

නොවිධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉතා ප්‍රබල මෙන් ම ආකර්ශණීය ඉගෙනුම් - ඉගැන්වීම් මෙවලමක් ලෙස ප්‍රයෝජනයට ගන්නා රූපවාහිනිය, ගුවන්විදුලිය හා සංයුක්ත තැටි බඳු ඉලෙක්ට්‍රොනික ඉගෙනුම් ද්‍රව්‍ය භාවිත කරමින් පාසල් ප්‍රජාව පමණක් නොව, ඊට පරිබාහිර විවිධ සමාජ කණ්ඩායම් ඉගෙනුම් සමාජයක් කරා ගෙන යෑමේ කාර්යභාරය විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව ඉටු කරයි. විෂයමාලාවේ දුරවබෝධ සංකල්ප පැහැදිලි කර දීම සඳහාත්, විෂයමාලාවේ සිදු කරන වෙනස්කම් පිළිබඳ ව ප්‍රජාව දැනුවත් කිරීම සඳහාත්, ගීතය, සංගීතය, නාට්‍ය වැනි සෞන්දර්යාත්මක මාධ්‍ය යොදා ගනිමින් ජන මනස පුබුදුවාලීම සඳහාත් විවිධ වැඩ සටහන් නිෂ්පාදනය කිරීම විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව විසින් ආයතනය ආරම්භයේ සිට ම කර ගෙන එනු ලබයි.

2018 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුවෙන් ඉටු කරන ලද කටයුතුවල ප්‍රගතිය පහත සඳහන් වෙයි.

- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද සාරවත් කිරීම සඳහා ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය වෙනුවෙන් අධ්‍යාපන ශ්‍රව්‍ය වැඩසටහන් 7ක් නිෂ්පාදනය කිරීම.
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද සාරවත් කිරීම සඳහා ප්‍රාථමික හා ද්විතීයික අංශ සඳහා අධ්‍යාපන විඩීයෝ වැඩසටහන් 50ක් (සිංහල /දෙමළ) නිෂ්පාදනය කිරීම.
- 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන ප්‍රචලිත කිරීම සඳහා වීඩියෝ වැඩසටහන් 10ක් නිෂ්පාදනය කිරීම.

## 6.3 මාර්ගෝපදේශන හා උපදේශන සේවා

පාසල් පද්ධතිය හා සම්බන්ධ ප්‍රජාවගේ මානසික ව්‍යාකූලතා නැති කිරීම සඳහා මනෝ සමාජයීය මැදිහත් වීමක් ලබා දීමේ අරමුණ ඇතිව 2006 වසරේ ජූනි මාසයේ දී නව උපදේශන හා මාර්ගෝපදේශන ඒකකයක් ජාතික අධ්‍යාපන ආයතනයෙහි ස්ථාපිත කරන ලදි. ශිෂ්‍ය ප්‍රජාව සඳහා වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන සේවා සැපයීම මෙම ඒකකයට පැවරී ඇති වගකීමයි. 2018 වර්ෂය අවසාන වන විට මෙම ඒකකය විසින් සම්පූර්ණ කරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- පාසල් සිසුන් හා දෙමාපියන් 39 දෙනෙකු සඳහා උපදේශන සැසි පැවැත්වීම.
- පාසල් උපදේශනය හා වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳව ගුරුවරුන් 166 දෙනෙකු දැනුවත් කිරීම.
- රැකියා ක්ෂේත්‍ර 16කට අදාළ වෘත්තීය මාර්ගෝපදේශන නාමාවලිය - 2017 (Job Inventory) සකස් කෙරෙමින් පවතී.

## 6.4 විවෘත ඉගෙනුම

විවිධ හේතු නිසා පාසල් අධ්‍යාපනය අහිමි වූ පුද්ගලයන්ට අධ්‍යාපනයේ මංපෙත් විවෘත කර දීම සඳහා දුරස්ථ පාඨමාලා පැවැත්වීම අරමුණු කරගෙන විවෘත පාසල් දෙපාර්තමේන්තුව පිහිටුවා තිබේ. විවෘත පාසල දුරස්ථ හා විවෘත ඉගෙනුම් ක්‍රම උපයෝගී කර ගනිමින් අධ්‍යාපනය ඉගෙනුම්ලාභියා වෙතට ගෙන යන ක්‍රියාවලියකි. අධ්‍යාපන සුදුසුකම්, රැකියාවක යෙදී සිටීම හෝ සමාජ ආර්ථික පසුබිම ආදී කිසිවක් නොසලකා සියලු දෙනාට ම අධ්‍යාපනය ලබා දීමේ අවස්ථා පුළුල් කිරීමක් එමගින් අපේක්ෂා කෙරේ. ඉගෙනුම්ලාභියාගේ අභිමතය පරිදි ඉගෙනුම ආරම්භ කර තමා කැමති මාධ්‍යයක් උපයෝගි කරගනිමින් උචිත පියවරක සිට ඉගෙනීම සඳහා විවෘත පාසල පහසුකම් සපයයි.

විවෘත පාසල් ඒකකය විසින් විවෘත ඉගෙනුම සම්බන්ධව 2018 වර්ෂයේ දී ඉටුකළ කාර්ය පහත සඳහන් වෙයි.

- පාඨමාලාවල උපදේශකවරුන් සඳහා ගණිතය හා විද්‍යාව විෂයයන්ට අතිරේක විෂයමාලා 2ක් සැකසීම.
- සාක්ෂරතා, පදනම් හා විවෘත ද්විතීයික පාඨමාලාවල උපදේශකවරු 30 දෙනකු යාවත්කාලීන කිරීම.
- විවෘත පාසල් ඉගෙනුම්ලාභීන් සඳහා අභිමුඛ සැසි 42ක් පැවැත්වීම.
- විවෘත පදනම් පාඨමාලාව සඳහා ඉගෙනුම්ලාභීන් 1600ක් හා විවෘත ද්විතීයික පාඨමාලාව සඳහා ඉගෙනුම්ලාභීන් 1600 දෙනෙකු බඳවා ගැනීම.

- ඉගෙනුම්ලාභින් 660 දෙනෙකු පදනම් පාඨමාලාව හා පාඨමාලාභින් 1467 දෙනෙකු විවෘත ද්විතීයික පාඨමාලාව සම්පූර්ණ කිරීම.

## 7.0 පර්යේෂණ, සැලසුම් හා සංවර්ධනය

අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය උදෙසා විෂයමාලා සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ඉවහල් වන විවිධ පර්යේෂණ කිරීම ජාතික අධ්‍යාපන ආයතනය මගින් ඉටු කරන අතර, යථෝක්ත කාර්ය යථාර්ථයක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු පර්යේෂණ දෙපාර්තමේන්තුව යටතේත් ආයතනයේ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් ලබා දීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සහ නියාමනය සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව යටතේත් ක්‍රියාත්මක වෙයි.

## 7.1 පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව

අධ්‍යාපන පර්යේෂණ ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම සහ නියාමනය අධ්‍යාපනයේ විවාදාත්මක අංශ සම්බන්ධ ව අදහස් හා මත සංවාදයට භාජනය කිරීම සඳහා සාකච්ඡා මණ්ඩප සැලසුම් කිරීම, අධ්‍යාපනයේ නියැළි පිරිස් තුළ පර්යේෂණ කුසලතා ප්‍රවර්ධනය සඳහා අවස්ථා සම්පාදනය, පුද්ගලයන්ට සහ ආයතනවලට පර්යේෂණ ප්‍රදාන ලබාදීම තුළින් පර්යේෂණ හැකියා සංවර්ධනයට අවස්ථා සැලසීම සහ පර්යේෂණ තොරතුරු ප්‍රචලිත කිරීම පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වෙයි. මෙම දෙපාර්තමේන්තුව විසින් 2018 දී නිම කරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- තෝරාගත් රටවල් කිහිපයක පාසල් වෘත්තීය විෂයමාලාව පිළිබඳ අධ්‍යාපනයේ කෙටුම්පත සැකසීම.
- 2020න් ඔබ්බට සිදුවන ඊළඟ විෂයමාලා ප්‍රතිසංස්කරණ සඳහා පූර්ණ පද්ධති විශ්ලේෂණය පිළිබඳ වාර්තාව සැකසීම.
- ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ සමගාමී ක්‍රියාකරකම් ක්‍රියාත්මක විමේ ස්වභාවය පිළිබඳ අධ්‍යයනය සිදු කරමින් පවතී.
- "සමානතාවයට එරෙහිව සමතාව" මැයෙන් 29 වන ආචාර්ය සි.ඩබ්.ඩබ්. කන්නන්ගර දේශනය ආචාර්ය සුනේත්‍රා කරුණාරත්න මහත්මිය විසින් පැවැත්වීම.
- සාර්ක් සඟරාවක් ප්‍රකාශයට පත් කිරීම යන ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ සඟරාව මුද්‍රණයට භාරදීම
- අධ්‍යාපන පර්යේෂණ ප්‍රදානය කිරිමේ ව්‍යාපෘතිය යටතේ පර්යේෂණ ප්‍රදාන 03ක් සිදු කිරීම සහ එම පර්යේෂණ වාර්තාවල පරිච්ඡේද සමාලෝචනය කිරිම.
- පර්යේෂණ ප්‍රචලිත කිරීමේ සම්මන්ත්‍රණ දෙකක් 61 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පැවැත්වීම.

- සන්දර්භ පුවත් සඟරාව (කාණ්ඩ -1) ප්‍රකාශයට පත් කිරීම සහ එම පුවත් සඟරාව පළාත් / කලාප අධ්‍යාපන කාර්යාල, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ සහ ගුරු පුහුණු මධ්‍යස්ථාන වලට බෙදා හැරීම සහ පුවත් පත්‍රිකාවේ (කාණ්ඩ 11) මුද්‍රණයට සුදානම් කිරීම.

## 7.2 සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව

ආයතනය සතු භෞතික, මූල්‍ය හා මානව සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝගී කර ගනිමින්, ආයතනයේ අරමුණු හා ඉලක්ක, ජාතික අරමුණු හා ඒකාබද්ධ කිරීමේ අභිලාෂය ඇති ව කටයුතු කිරීම සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරයයි.

2018 වසරේ සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව ඉටුකළ ප්‍රමුඛ කාර්ය පහත සඳහන් වෙයි.

- 2017 වර්ෂයේ වාර්ෂික ප්‍රගති වාර්තාව සකස් කිරීම.
- 2019 වර්ෂයට අදාළ අයවැය ඇස්තමේන්තුව සහ 2019 අයවැය වාර්තාව, 2019 - 2023 උපායමාර්ග කළමනාකරණ සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කිරීම.
- දේශිය හා විදේශිය මූල්‍ය ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති නියාමනය සඳහා කාර්තුමය ප්‍රගති වාර්තා 4ක් සකස් කිරීම.
- වෙනත් ආයතන වෙත ඉදිරිපත් කිරීමට පහත සඳහන් ප්‍රගති වාර්තා සකස් කිරීම.
    - මහ බැංකුවට ඉදිරිපත් කිරීමට ප්‍රගති වාර්තා 2ක් සකස් කිරීම.
    - රාජ්‍ය භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීමට ප්‍රගති වාර්තා 02ක් සකස් කිරීම.
    - ADB,TSEP සහ UNICEF යනාදි විදේශිය මූල්‍යාධාර ආයතන වලට ඉදිරිපත් කිරීමට කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කිරීම.
- 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

## 8.0 පරිපාලන, මූල්‍ය හා සහාය සේවා

ආයතනයේ විෂයමාලා සංවර්ධන, අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා ගුරු අධ්‍යාපන සහ සැමට අධ්‍යාපන, පර්යේෂණ, සැලසුම් හා සංවර්ධන පීඨ මගින් කරනු ලබන සියලු ම කාර්ය සඳහා මූල්‍ය, භෞතික සම්පත් හා කළමනාකරණ සේවා සම්පාදනය සහ සහාය සේවා සැපයීම, පරිපාලන, මූල්‍ය හා සහායක සේවා අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. පරිපාලන මූල්‍ය හා සහාය සේවා අංශය යටතේ ක්‍රියාත්මක වන ඒ ඒ දෙපාර්තමේන්තු විසින් 2018 වසරේ දී ඉටුකරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

## 8.1 පරිපාලන දෙපාර්තමේන්තුව

ආයතනයේ එදිනෙදා පරිපාලන කාර්ය හා සම්බන්ධ සියලු ම කටයුතු හා කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඔවුන්ට අදාළ පුහුණු අවස්ථා ලබා දීමේ කටයුතු මානව සම්පත් සංවර්ධන හා පරිපාලන දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි.

එදිනෙදා ඉටු කරනු ලබන සාමාන්‍ය පරිපාලන රාජකාරි කටයුතුවලට අමතරව, 2018 ජනවාරි - දෙසැම්බර් කාලසීමාව ඇතුළත වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව පරිපාලන දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන බඳවා ගැනීම් සිදු කර ඇත.

- <u>බඳවා ගැනීම්</u>

| | | |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ ජනරාල් | - | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | - | 01 |
| සහකාර කථිකාචාර්ය | - | 02 |
| සිවිල් ඉංජිනේරු | - | 01 |
| විගණන සහකාර | - | 02 |

**<u>උසස්වීම්</u>**

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ | - | 01 |
| කළමනාකරණ සහකාර 11 | - | 12 |
| තාක්ෂණ සහකාර 11 (තාක්ෂණික නොවන) | - | 12 |
| රියදුරු | - | 01 |

- ඊට අමතර ව ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 54 දෙනෙකු විසින් පාඨමාලා හැදෑරීම සම්බන්ධව කරන ලද ඉල්ලීම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන මෙන් ම අධ්‍යයන නිවාඩු ලබා දීම.

## 8.2 මුදල් දෙපාර්තමේන්තුව

ආයතනයේ සියලු ම කාර්ය සඳහා මූල්‍ය සම්පත් ලබා දීම, ආදායම් හා පිරිවැය වාර්තා මූල්‍ය නීතිරීති අනුව පවත්වාගෙන යෑමේ කටයුතු මුදල් දොපර්තමේන්තුව මගින් සිදු කරයි. ඒ යටතේ එම දෙපාර්තමේන්තුව ඉටු කළ ප්‍රධාන වැඩසටහන් පහත සඳහන් වෙයි.

- ස්ථාවර වත්කම් ලේඛනය හා ඇගයීම් පටිපාටි සකස් කොට අවසන් කිරීම (2017)
- 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අවසන් කිරීම.
- 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අවසන් වාර්තාව සකස් කිරීම.

## 8.3 ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව

ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරිම, නඩත්තු කටයුතු, විදුලි සහ දුරකථන සේවා පවත්වා ගෙන යාම, යටිතල පහසුකම් සැපයීම, පවිත්‍රතා සහ ආරක්ෂක සේවා සම්බන්ධීකරණය හා ආයතනයේ භෞතික පරිසරය අධ්‍යාපනික කාර්යවලට සමීප වන අයුරින් පවත්වාගෙන යාම ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලැබේ. ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් 2018 වර්ෂයේ දෙසැම්බර් වන විට ඉටුකර ඇති කාර්ය පහත දැක්වේ.

- මහරගම පරිශ්‍රයේ ඉදිකරන පස් මහල් ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම.
- මීපේ පරිශ්‍රයේ ඉදි කරන තුන් මහල් නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම.
- ආයතනයේ සූර්ය බලශක්ති පද්ධතියක් සවි කිරීමේ වැඩ කටයුතු වලින් 75%ක් සම්පූර්ණ කිරීම (2වන අදියර)
- මහරගම පරිශ්‍රයේ 600 KVA ඩීසල් ජෙනරේටරයක් සවි කිරීම.
- ආයතනයේ පොම්පාගාරය සඳහා නව පොම්පයක් සවි කිරීම.
- ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන ශ්‍රවනාගාරය සඳහා ඩිජිටල් ඇමතුම් පද්ධතියක් සවි කිරීම.
- ආයතනයේ ගොඩනැගිලි නඩත්තු කටයුතු 05ක් සම්පූර්ණ කිරීම.
- මහරගම සහ මීපේ පරිශ්‍රයෙහි ලොකු කුඩා ප්‍රතිසංස්කරණ හා අලුත්වැඩියා කටයුතු 24ක් සම්පූර්ණ කිරීම.
- ආයතනයේ යන්ත්‍රෝපකරණ පුනරුත්ථාපන කටයුතු 3ක් සම්පූර්ණ කිරීම.

## 8.4 පුස්තකාල සේවා

ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාලය ආයතනයේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට අමතරව, අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධ විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්, ගුරුවරුන් හා සිසුන් මෙන්ම අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු විදුහල් කථිකාචාර්යවරුන් සහ වෙනත් ආයතනවල අධ්‍යාපනඥයින්ගේ නිරන්තර පරිහරණයට බඳුන් වේ. එම පුස්තකාලයට 2018 වසරේ දී අලුතින් එකතු කරගන්නා ලද පොත් පත් හා සංයුක්ත තැටි ප්‍රමාණය පහත දක්වේ.

| | | |
|---|---|---|
| පොත් | - | 2051 |
| පොත් (පරිත්‍යාග) | - | 15 |
| විෂයමාලා ද්‍රව්‍ය | - | 646 |
| අධ්‍යාපනික වාර්තා | - | 127 |
| දේශීය වාර සඟරා (පරිත්‍යාග) | - | 10 |

| | | |
|---|---|---|
| දේශීය වාර සඟරා | - | 08 |
| විදේශීය වාර සඟරා (පරිත්‍යාග) | - | 12 |
| විදේශිය සඟරා | - | 06 |
| ජා.අ.ආ එකතුව | - | 270 |
| පුවත් සඟරා | - | 10 |
| DVD / CD | - | 14 |

### 8.5 මුද්‍රණ හා ප්‍රකාශන

මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය තුළ මුද්‍රණය කරන ලද ප්‍රකාශන වර්ගය හා ප්‍රමාණය පහත දැක්වේ.

- ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ - 05
- විෂය නිර්දේශ - 18
- ගුරු පුහුණු අත්පොත් - 14
- අමතර ප්‍රකාශන - 84
- සහතික - 22
- ලිපි කවර - 08
- අමතර ප්‍රකාශන - 97
- ආරාධනා පත්‍ර - 05
- වෙනත් දේ - 08

ඉහත සඳහන් මුද්‍රණ සහ ප්‍රකාශන කාර්යයන්ට අමතරව, පොත් ප්‍රදර්ශන අවස්ථා පහකට සහභාගි වීමට 2018 වසරේ දී අවස්ථාව ලබා ගෙන ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඊඩියූ/සී/එන්අයිඊ/එෆ්ඒ/1/18 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 මැයි 31 දින

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික අධ්‍යාපන ආයතනය

**ජාතික අධ්‍යාපන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රමිත අංක 01 හි 80 වන වගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාරව මාස 12 ක් ඇතුලත දී නිරවුල් කිරීමට නියමිත ගනු දෙනු ජංගම වගකීම් ලෙස ද ,අනෙකුත් සියළුම වගකීම් ජංගම නොවන වගකීම් ලෙස ද , වර්ගීකරණය කල යුතු වුව ද 2006-2015 දක්වා වර්ෂ 09 ක කාල සීමාවට අදාලව ගෙවිය යුතු ඇස්තමේන්තුගත අර්ථ සාධක අර මුදල් සහ අධිභාර වටිනාකම වූ රු.72,168,213 ක් වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් ජංගම වගකීම් ලෙස දක්වා තිබුණි.

(ආ) ප්‍රමිත අංක 02 අනුව පිළියෙල කළ යුතු මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පාරිතෝෂික ගෙවීම් වටිනාකම රු.5,547,436 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර කාරක ප්‍රග්ධන වෙනස්වීම් තුල උපචිත වියදම් වැඩිවීම 3,026,822 කින් වැඩියෙන් දක්වා තිබුණි.එසේම මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය රු.64,483,552 ක් වුවද එය රු.61,456,730 ක් ලෙස රු.3,026,822 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ප්‍රමිත අංක 03 හි 47 (ආ) වගන්තිය ප්‍රකාරව ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වල වැරදි , ඒවා සොයා ගැනීමෙන් පසුව වත්කම් හා වගකීම් වල ආරම්භක ශේෂයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කල යුතු වුව ද ආයතනයේ පෙර වර්ෂ වල වැරදි සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රමිත 07 හි 47 වන වගන්තිය ප්‍රකාරව වත්කමක සාධාරන අගය එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට ප්‍රත්‍යාගණනයක් සිදු කළ යුතු වුවද ආයතනයේ වත්කම් 2008 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුණු රු.10,000,000 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණු අතර 2018 වර්ෂය සඳහා ලැබුණු රු.58,000,000 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි

(ආ) 2018 දෙසැම්බර් 31 දින ජංගම ගිණුම් අංක 607624 න් ජංගම ගිණුම් අංක 607628 ට රු.6,000,000 ක් මාරු කර තිබුණි.මෙහිදී අංක 607628 දරන ගිණුමට මුදල් එකතු වීමට අදාළ ගිණුම් සටහන තබා තිබුණ ද අංක 607624 දරන ගිණුමෙන් මුදල් අඩු කිරීමට අදාළ ගිණුම් සටහන තබා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබුණු රු.7,245,228 ක භාණ්ඩාගාර බිල්පත් පොලිය සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස සටහන් කිරීම හා ලැබිය යුතු පොලී ලෙස සටහන් කිරීම නිසා වර්ෂයේ ආදායම හා ජංගම වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ගෙවිය යුතු අර්ථ සාධක අරමුදල් හා අධිභාර මුදල කම්කරු දෙපාර්තමේන්තුව විසින් රු.68,995,393 ක් ලෙස ගණනය කර 2018 දෙසැම්බර් 15 එවා තිබුණ ද එම වටිනාකම සැලකිල්ලට නොගෙන එම කාලපරිච්ඡේදයට අදාළ ගෙවිය යුතු අර්ථ සාධක අරමුදල් වටිනාකම රු.72,168,213 ක් ලෙස රු.3,172,820 ක් වැඩියෙන් ගිණුම් වල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ආයතනයට ලැබුණු පුනරාවර්තන මුදල් ප්‍රදාන රු.5,000,000 ක් ප්‍රාග්ධන ලැබීමක් ලෙස සටහන් කිරීම නිසා එම ප්‍රමාණයෙන් වර්ෂයේ අතිරික්තය හා ප්‍රාග්ධන ප්‍රදාන අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) අධ්‍යාපන අමාත්‍යාංශයෙන් 2018 වර්ෂය තුලදී විවිධ ව්‍යාපෘති වලින් (ESEP, TSEP, UNICEF, KORIEA) ලබාදුන් රු.407,909,988 ක් වූ ප්‍රාග්ධන ප්‍රතිපාදන වටිනාකමින් රු.359,084,500 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණි.

### 1.2.3 නොසැසඳුනු පාලන ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල පැවති අවසන් ශේෂ සමාලෝචිත වර්ෂයේ ලෙජයේ ආරම්භක ශේෂ ලෙස සටහන් කිරීමේදී වෙනස්කම් පැවති අතර ඒ අනුව ගිණුම් 03 කට අදාලව එකතුව රු.73,452,842 ක නොසැසඳීම් තිබුණි.

(ආ) ගිණුම් 04 කට අදාලව ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු අවසාන ශේෂ සහ ප්‍රවර්ථන වර්ෂයේ ලෙජරයේ දක්වා තිබුණු ශේෂ අතර එකතුව රු.152,372,606 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන වල සඳහන් ශේෂ හා විගණනයට ඉදිරිපත් කර තිබූ උපලේඛන වල ශේෂ අතර රු.735,644 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

(ඈ) ගිවිසුම් උල්ලංඝණය කිරීමේ ගිණුමේ මූල්‍ය ප්‍රකාශන වල සඳහන් ශේෂය හා ශේෂ පිරික්සුම අනුව ශේෂය අතර රු.3,187,465 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

2008 වර්ෂයට පෙර ආරම්භක ශේෂය ලෙස ඇති රු.45,034,652 ක් වටිනා පුස්තකාල පොත් සම්බන්ධව භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුනු අතර උපලේඛනයක් ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 1.2 වගන්තිය 6.1 වගන්තිය | අතිකාල ගෙවීම් රේට ගණන් බැලිය යුත්තේ මාසික ඒකාබද්ධ වැටුප (දීමනා හැර) පදනම් කර වුවත් 1995 මාර්තු 22 දිනැති අංක සී/එස්/811/617/94 දරන සහකාර කම්කරු කොමසාරිස්වරයෙකුගේ උපදෙස් ලිපියක් පදනම් කරගෙන 2016 වර්ෂයේ සිට දළ වැටුප පදනම් කරගෙන අතිකාල දීමනා ගණනය කර තිබුණු අතර භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2016 හා 2017 වර්ෂ සඳහා හිඟ අතිකාල දීමනා ලෙස රු.27,301,283 ක් ද 2018 වර්ෂයට අදාල අතිකාල දීමනා සඳහා රු.59,593,538 ක් ද වශයෙන් එකතුව රු.86,894,821 ක මුදලක් ප්‍රවර්ථන වර්ෂයේදී ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2018 මාර්තු 19 දිනැති 01/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමණාකරණ චක්‍රලේඛය | චක්‍රලේඛ ප්‍රකාරව රජයේ ආයතන විසින් අලෙවි කරනු ලබන රථ වාහන වල අලෙවි වටිනාකම රජයේ ඒකාබද්ධ අර මුදලට බැර කල යුතු වුවත් මෙම වාහන අලෙවියෙන් ලද රු.2,524,000 ක මුදල එසේ කර නොතිබුණි. |
| (ඇ) | භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් 2013 වර්ෂයේදී අනුමත කර ඇති අංක 257 දරන චක්‍රලේඛය | ආයතනයේ නිලධාරීන්ගේ වැටුපට අමතරව උපයන ඉපයීම් ඔවුන්ගේ වාර්ෂික මූලික වැටුපෙන් සියයට 50 නොඉක්මවිය යුතු වුවත් ඊට පටහැනිව 2014 සිට 2017 වර්ෂය දක්වා නිලධාරීන් 48 දෙනෙකුට රු.4,501,586 ක් ද 2018 වර්ෂයේදී ද නිලධාරීන් 37 දෙනෙකුට රු.3,185,113 ක් ද දීමනා වශයෙන් ගෙවා තිබුණි. |

**2.3** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**2.4** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) මුද්‍රණාලයේ වසර 30 කටත් වඩා පැරණි යන්ත්‍ර සූත්‍ර වූ අකර-ඩිජිටල් වර්ගයේ මුද්‍රණ යන්ත්‍රයක් ඇතුළු අයිතම 12 ක අවශ්‍යතාවය පැවතිය ද ඔෆ්සෙට් යන්ත්‍රයක් මිල දී ගැනීම සඳහා 2017 මාර්තු 20 දින රු.74,370 ක් වැය කර පුවත් පත් දැන්වීමක් පළ කර තිබු නමුත් එම යන්ත්‍රය ද මිලදී ගෙන නොතිබුණු අතර 2018 වර්ෂයේදී අතිකාල දීමනා ලෙස රු.5,445,741 ක් මුද්‍රණාලයේ සේවකයන්ට ගෙවා තිබියදීත් මුද්‍රණ කටයුතු බාහිර පොත් මුද්‍රණ ආයතන මගින් ඉටු කරගෙන ඒ සඳහා රු.9,129,735 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) මුද්‍රණ කටයුතු සඳහා 2018 වර්ෂයට අදාළව වැඩ 243 ක් විවිධ අංශ විසින් ලබා දී තිබුණු අතර ඉන් වැඩ 25 ක් 2018 වර්ෂය අවසන් වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.එසේම 2018 වර්ෂය තුළ මුද්‍රණාලය මගින් නිම කර තිබුණු වැඩ 272 ක ප්‍රමාණයෙන් වැඩ 54 ක් 2014,2016 සහ 2017 වර්ෂ

වලට අදාළ කාර්යයන් වූ අතර මුද්‍රණ කටයුතු කිරීම සඳහා සැලසුම් සකස් කර ඒවා නියමිත කාල සීමා වලදී සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2017 සහ 2018 වර්ෂ වලට අදාළ නව විෂය මාලාව ක්‍රියාත්මක කල යුතු 12 සහ 13 ශ්‍රේණි වල ජීව විද්‍යාව , භෞතික විද්‍යාව , රසායන විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන්ට අදාළ ගුරු අත්පොත් වල මෘදු පිටපත් ආයතනය විසින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත ප්‍රමාද වී භාර දී තිබුණු අතර මේ හේතුව නිසා සාධාරණ කාලයක් තුළ ගුරු අත් පොත ගුරුවරයා අතට ලැබී නොතිබුණි.

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 වගන්තිය ප්‍රකාරව සියළුම ලංසු කරුවන්ගෙන් ලංසු සුරක්ෂණ ලබා ගත යුතු වුව ද රු.765,072 ක වියදමින් පරිගණක ශාලාව සඳහාත් රු.1,277,460 ක වියදමින් අන්තර්කරණ දෙපාර්තමේන්තු සඳහාත් වායු සමීකරණ යන්ත්‍ර මිල දී ගැනීමේ ප්‍රසම්පාදනයන්හිදී ලංසු සුරක්ෂණ ලබාගෙන නොතිබුණි.

(ඊ) 2008 වර්ෂයේදී ඇස්තමේන්තුගත පිරිවැය රු.27,848,100 ක් වූ ආයතනයේ තෙමහල් නේවාසිකාගාරයේ වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම වෙනුවෙන් සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම් සඳහා වූ උපදේශක ගාස්තු ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 05 ක් එනම් රු.1,200,949 ක් ගෙවා වසර 10 ගතවී තිබුණ නමුත් එහි ඉදි කිරීම කටයුතු 2018 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි.

## 2.5 වෙනත් නිරීක්ෂණ

(අ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව" සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතු අතර ඒ පිළිබඳව 2017 ඔක්තෝබර් 03 දිනැති 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත සම්මත කර චක්‍රලේඛ මගින් සියලු රජයේ ආයතන දැනුවත් කර තිබුණි. ඒ අනුව , තම විෂයය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව සියළුම රාජ්‍ය ආයතන දැනුවත් විය යුතු වුව ද ආයතනය ඒ සම්බන්ධයෙන් දැනුවත් වී නොතිබීම හේතුවෙන් ඒකී කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද එම සැලසුම් නිසියාකාරව ක්‍රියාත්මක කර නොතිබුණු අවස්ථා තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තු 3 ක් මගින් විෂයයන් 4 ක් සඳහා ගුරු මාර්ගෝපදේශ අත්පොත් සකස් කිරීම සඳහා

සැලසුම්කර තිබුණද විෂයයන් 03 ක් සඳහා ගුරු මාර්ගෝපදේශ අත්පොත් සකස් කර නොතිබූ අතර විෂයයන් 07 කට අදාල සම්පත් දායක පොත් සකස් කිරීමට සැලසුම් කර තිබුණ ද විෂයයන් 06 කට අදාල සම්පත් දායක පොත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට සකස් කර නොතිබුණි.ඉන් විෂයයන් 04 කට අදාළ සම්පත් දායක පොත් 2017 වර්ෂයේදී අවසන් කිරීමට සැලසුම් කල පොත් විය.

(ඈ) ආයතනය විසින් 2018 වර්ෂයේදී විභාග 20 ක් පවත්වා තිබුණු අතර විභාග 09 ක ප්‍රතිඵල විගණිත දිනය වූ 2019 මාර්තු 31 වන විටත් නිකුත් කර නොතිබුණු අතර පවත්වන ලද විභාග 03 කට අදාළ ප්‍රතිඵල නිකුත් කිරීමට වසර 1 කට ආසන්න කාලයක් ප්‍රමාද වී තිබුණි.

(ඇ) විභාග පරිපාලන කටයුතු සිදු කිරීම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා නොගත් කෙටුම්පත් උපදෙස් සංග්‍රහයක් මගින් විභාග කටයුතු සිදු කර තිබුණි. එහෙත් නව සංශෝධනයන් සහිත විභාග උපදෙස් සංග්‍රහයක් සඳහා 2018 ඔක්තෝම්බර් 18 දින පාලක මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය ක්‍රියාත්මක මට්ටමකට පත්ව නොතිබුණි.

(ඉ) රු.28,187,054 ක ගෙවිය යුතු තැන්පතු තුල වර්ෂ 5 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.8,417,315 ක තැන්පතු නිරවුල් කිරීමට හා විවිධ ණය ගැති ශේෂය තුළ ඇති වර්ෂ ගණනාවක සිට අයවිය යුතුව පැවති රු.346,040 ක ශේෂය ප්‍රවර්ථන වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) අයවැය ගත පුනරාවර්තන වියදම් තථ්‍ය වියදම් සමග සැසඳීමේදී සියයට 5.7 සිට සියයට 3,303 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අය වැය ලේඛනය ඵලදායි කළමණාකරන පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

**ජාතික අධ්‍යාපන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාළ පැහැදිලි කිරීම් වාර්තාව**

1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

(අ) ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල (EPF) හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF) වශයෙන් රු. 76,591,619/06 ක් 2017 මූල්‍ය ප්‍රකාශන වල ජංගම වගකීම් ලෙස දක්වා තිබූ අතර එම මුදලින් ගෙවිය යුතු සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට අදාළ රු. 4,423,405/99 ක මුදල 2018 වර්ෂය තුළ ගෙවා අවසන් කර ඇත. රු. 72,168,213/- ක් වන ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල 2018 වර්ෂය ඇතුළත ගෙවා අවසන් කිරීමට අපේක්ෂා කල බැවින් ජංගම වගකීම් වශයෙන් දැක්වුව ද එක් එක් සේවකයාට බැර විය යුතු මුදල කම්කරු දෙපාර්තමේන්තුව මඟින් තහවුරු කරන තෙක් ගෙවීම් සිදු කිරීමට හැකියාවක් නොමැති වූ හෙයින් මෙම මුදල ගෙවීමට නොහැකි වී ඇත. එම නිසා 2019 වර්ෂය තුළ ගෙවීමේ අපේක්ෂාවෙන් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ද ජංගම වගකීම් වශයෙන් මෙම මුදල දක්වා ඇත.

(ආ) 2018 වර්ෂයේ ගෙවන ලද පාරිතෝෂික මුදල ගණනය කිරීමේ දී පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුමට හර කරන ලද ජ'නල් සටහන් අංක 48 නොසලකා ගණනය කිරීම හේතුවෙන් මෙම වරද සිදු වී ඇත. එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

2017 වර්ෂය දක්වා ආයතනයේ ගිවිසුම් කඩ කරන නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් මූල්‍ය ප්‍රකාශන වල විලම්භිත ආදායම් (Deferred Income) ගිණුමට ගිණුම්ගත කර ජංගම නොවන වගකීම් වශයෙන් දක්වා තිබුණි. සත්‍ය වශයෙන්ම මෙම මුදල් ආයතනයට ලැබිය යුතු ශේෂයක් වන බැවින් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල හිමිකම් යටතේ ගිවිසුම් කඩකිරීමේ අරමුදල (Bond Violation Fund) නම් වූ ගිණුමක දැක්වීමට කටයුතු කරන ලදී. උක්ත ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂයන් අතර වෙනස වන රු. 3,026,822/- ක මුදල ගෙවිය යුතු වියදම් වල වෙනසට එකතු වීම හේතුවෙන් මෙම වරද සිදු වී ඇත. එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති ශේෂයන් එකතු කිරීමේ දී ගිවිසුම් කඩකිරීමේ අරමුදල (Bond Violation Fund) යටතේ දක්වා ඇති රු. 3,026,822/- මඟ හැරී ඇත. ඒ හේතුවෙන් මෙම වෙනස ඇති වී තිබේ. එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) 2019 වර්ෂය සඳහා ආරම්භක ශේෂ ඇතුළත් කිරීමට පෙර විගණන විමසුමේ පෙන්වා දී ඇති නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. 2019 අගෝස්තු 31 දිනට පෙර වාර්තාව ලබා දීමට අදාළ ආයතනය එකඟ වී ඇත.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2017 දෙසැම්බර් 31 දින අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුණු රු. 10,000,000/- ක මුදල 2018 වර්ෂයේ ජනවාරි මස බැංකු ගිණුමේ සටහන් වී ඇත. එබැවින් එම මුදල 2018 වර්ෂයේ ආදායම් ලෙස වැරදීමකින් ගිණුම් ගත වී ඇත. එය 2019 වර්ෂයේ ගිණුම් වල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

2018 වර්ෂයේ දෙසැම්බර් 31 දින අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුණු රු. 58,000,000/- ක මුදල බැංකු ගිණුම් විස්තරයේ ඇත්තේ 2019 වර්ෂයේ ජනවාරි මාසයේය. එබැවින් 2018 වර්ෂයේ ගිණුම් වලින් අත්හැරී ඇත. මෙම දෝෂය 2019 වර්ෂයේ ගිණුම් වල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) 2018.12.31 දින ජංගම ගිණුම් අංක 607628 න් ජංගම ගිණුම් අංක 607624 ට රු.මි. 6 ක් මාරු කරන ලදී. එහි දී බැර සටහන් පමණක් අරමුදල් මාරු කිරීම් (Transfer of Funds) ගිණුමට සටහන් කර ඇතත් හර සටහන ඇතුළත් නොවීම හේතුවෙන් 2018.12.31 දිනට මුදල් ශේෂය රු.මි. 6 ක් වැඩියෙන් පෙන්වීම නිවැරදි කිරීම සඳහා අදාළ සටහන් යොදන ලදී.

(ඇ) පහත සඳහන් ජ'නල් සටහන මඟින් 2018 මූල්‍ය ප්‍රකාශන වලට අදාළ වැරදි නිවැරදි කිරීම් යටතේ නිවැරදි කරනු ලැබේ.

349 – Interest from Treasury Bills (Dr)

309 – Course fee & Other Received in Advance (Cr)

(ඇ) ජාතික අධ්‍යාපන ආයතනයේ 2006 - 2015 වර්ෂය දක්වා සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට එකී කාලය තුළ ජීවන වියදම් දීමනාවට අදාළ සේවක අර්ථසාධක මුදල, සේවක අර්ථසාධක අරමුදලට බැර නොකිරීම නිසා එම කාලයට ගෙවිය යුතු හිඟ සේවක අර්ථසාධක අරමුදල් ප්‍රමාණය රු.46,154,508/30 ක් වේ. මෙම මුදලට 50% ක අධිභාරය එකතු කළ විට ගෙවිය යුතු මුළු සේවක අර්ථසාධක දායක අරමුදල් ප්‍රමාණය රු. 69,231,762/45 ක් වේ.

එහෙත් කම්කරු දෙපාර්තමේන්තුව විසින් ඉහත කාලයට අදාළව ගෙවිය යුතු හිඟ සේවක අර්ථසාධක අරමුදල් ප්‍රමාණය රු. 68,995,393/01 ක් වශයෙන් දක්වා ඇත. මෙම ගණනය කිරීම දෝෂ සහිත බැවින් ඒ පිළිබඳව ජාතික අධ්‍යාපන ආයතනය විසින් කම්කරු දෙපාර්තමේන්තුව දැනුම්වත් කිරීමට කටයුතු කරන ලද අතර, එහිදී කම්කරු දෙපාර්තමේන්තුවෙන් එම ගණනය කිරීම වැරදි ආකාරයට සිදුව ඇති බව තහවුරු විය.

තවද, ඉහත කාලසීමාවට අදාළව නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ නඩු පැවරීම නිසා විශ්‍රාම ගිය කාර්ය මණ්ඩල සාමාජිකයන් 10 දෙනෙකුට රු. 473,895/- ක මුදලක් 2017.09.18 දින අධිකරණය වෙත ගෙවා ඇත.

එහෙයින් ඉහත ගණනය කර ඇති රු. 69,231,762/45 ක මුදලින් අධිකරණය හමුවේ ගෙවීම් කරන ලද රු. 473,895/- ක මුදල අඩු කළ යුතුවේ. ඒ අනුව ගෙවිය යුතු නිවැරදි සේවක අර්ථසාධක හිඟ දායක මුදල රු. 68,757,867/45 කි.

මෙම මුදල නිවැරදි කරන ලෙසට මහරගම සහකාර කම්කරු කොමසාරිස් වෙත 2019.01.17 දින ලිඛිතව දැනුම් දී ඇත. ඒ අනුව අධිභාරය සමඟ බැරවිය යුතු හිඟ අර්ථසාධක මුදල රු. 68,757,867/21 ක් බව 2019.06.21 දින මහරගම සහකාර කම්කරු කොමසාරිස් විසින් දැනුම් දී ඇත.

(ඉ) 2018 ජුනි මස ලැබුණු පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් යන වියදම් දෙක ම සඳහා එකම ලැබීමක් ලෙස බැංකුවට බැර වී ඇත. එබැවින් මුළු මුදලම ප්‍රාග්ධන ලැබීම් ලෙස ගිණුම් ගත වී ඇත. මෙම දෝෂය 2019 මූල්‍ය ප්‍රකාශන වලට අදාළ වැරදි නිවැරදි කිරීම් යටතේ නිවැරදි කරනු ලැබේ.

(ඊ) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබාදෙන සියළු ප්‍රතිපාදන ප්‍රාග්ධන වියදම් ලෙස වර්ගීකරණය කර ඇති නමුත් ආයතනයේ අය වැය සකස් කිරීමේදී වියදම් වර්ගය අනුව ප්‍රාග්ධන හා පුනරාවර්තන ලෙස වර්ගීකරණය කෙරේ. එසේම අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වැය ශීර්ෂයෙන් මෙම මුදල ලබා දී ඇතත් මෙය පුනරාවර්තන වියදමකි. එබැවින් අප ආයතනය විසින් එම මුදල වියදම් කර ඇත්තේ 2018 වර්ෂය සඳහා වූ වාර්ෂික සැලසුමට අනුව පුනරාවර්තන වියදම් ලෙසින් නිසා මෙය පුනරාවර්තන වියදම් ලෙස ගිණුම් ගත කර ඇත.

1.2.3 **නොසැසඳුනු පාලන ගිණුම්**

(අ) **සමුච්චිත අරමුදල**

සමුච්චිත අරමුදලේ ආරම්භක ශේෂයේ වෙනස පරිගණක මෘදුකාංගයේ ආරම්භක ශේෂ ඇතුළත් කිරීමේ දී ඇති වූ ගැටලුවක් හේතුවෙන් සිදු වී ඇත. එම වෙනස රු. 376,603/36 ක් වේ. එය මේ වන විට නිවැරදි කර ඇත.

**අතිරික්තය**

මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 13 හි Excess of Expenditure Over Income ගිණුම යටතේ 2017/12/31 දිනට රු.82,516,984/63 ක අතිරික්තයක් පෙන්වා ඇත. ජ'නල් සටහන් අංක 66 යටතේ සමුච්චිත අරමුදල් ගිණුමට හර කරන ලද රු. 76,571,619/06 ක මුදල, අතිරික්තය ගිණුමට බැර කර ඇත. ඒ අනුව ගිණුමේ ආරම්භක ශේෂය රු. 155,052,076/69 ක් වන අතර සටහන් අංක 13 පරිදි 2017.12.31 දිනට සමුච්චිත අරමුදල් ගිණුමේ අවසාන ශේෂය රු. 38,277,635/79 ක් වේ. 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී වැරදි නිවැරදි කිරීම් වලට අදාල ජ'නල් සටහන් අංක 3A, 48, 51, 55, 62, 69, 71 සහ 50 සමුච්චිත අරමුදල් ගිණුමට ගලපා ඇති බැවින් එම ගැලපීම් වල මුළු එකතුව රු. 67,202,479/63 ක් වේ.

**තොග ගිණුම**

ලෙජරය අනුව තොග ගිණුමේ ආරම්භක ශේෂය නිවැරදිය. 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී උපලේඛනයේ තොරතුරු පරිගණක ගත කිරීමේ දී සිදු වූ දෝෂය මෙම වෙනසට හේතු වී ඇත.

මින් ඉදිරියට මෙවැනි අඩුපාඩු ඇති නොවන ලෙස කටයුතු කිරීමට අදාළ නිලධාරීන් දැනුම්වත් කිරීමට අධ්‍යක්ෂ (මුදල්) වෙත උපදෙස් ලබා දෙන ලදී.

(ආ) කෙටුම්පත් විගණන වාර්තාව අනුව පහත ගිණුම් 03 මගින් මෙම වෙනස ඇතිවී තිබුණි.

| | (රු.) |
|---|---|
| සමුච්චිත අරමුදල් ගිණුම | 11,294,325/- |
| අතිරික්තය | 137,890,816/- |
| Bond Violation Fund | 3,187,465/- |
| එකතුව | 152,372,606/- |

**සමුච්චිත අරමුදල් ගිණුම**

2018.12.31 දිනට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය වශයෙන් සටහන් අංක 13 හි දක්වා ඇත්තේ පෙර වර්ෂයේ නිවැරදි කරන ලද ආරම්භක ශේෂයයි. මේ තුළ 2017 වර්ෂයට අදාල අතිරික්තය ගිණුමේ ශේෂය ද ඇතුලත් ය. පෙර වර්ෂයේ සමුච්චිත අරමුදලේ ශේෂය වන රු. 40,182,821/84 (හර) ශේෂයට මෙම වසරේ කරන ලද වැරදි නිවැරදි කිරීම් වලට අදාලව ජ'නල් සටහන් අංක 66 මගින් කරන ලද ගැලපීමට පසු එම ශේෂය රු. 116,774,440/60 (හර) බවට පත් වේ. ඊට අමතරව 2018 වර්ෂය තුළ වැරදි නිවැරදි කිරීම් වලට අදාලව මෙම ගිණුමට යොදන ලද මුළු එකතුව රු. 67,202,479/63 ජ'නල් සටහන් ගැලපූ විට අවසන් ශේෂය වශයෙන් රු. 49,571,961/27 ක් වේ.

**අතිරික්තය**

ශේෂ පිරික්සුම අනුව ශේෂය වශයෙන් දක්වා ඇත්තේ 2018.01.01 දිනට නිවැරදි කරන ලද ආරම්භක ශේෂය වේ. එය රු. 155,052,076/69 කි. මෙය මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සටහන් අංක 13 හි දක්වා ඇති අතර රු. 21,197,787/65 ක් වශයෙන් දක්වා ඇත්තේ 2018 වර්ෂයට අදාළව ආදායම් සහ වියදම් ගිණුමේ අතිරික්තය වේ. එය සටහන් අංක 13 හි අතිරික්තය වශයෙන් දක්වා ඇත. ලෙජරය අනුව ශේෂය රු. 155,052,077/- ක් වේ.

**ගිවිසුම් උල්ලංඝණය කිරීමේ අරමුදල** (Bond Violation Fund )

උක්ත ගිණුමේ වෙනස වශයෙන් දක්වා ඇත්තේ ආයතනයේ ගිවිසුම් කඩ කිරීමට අදාලව ආයතනයේ නිලධාරියෙකු වන රසික බාලසූරිය මහතාගෙන් අයවිය යුතු රු. 3,187,465/- ක් වන මුදලයි. මෙම මුදල ලැබිය යුතු මුදලක් වන හෙයින් ලැබිය යුතු ද (Receivable) ගිණුමට හර කර ඇති නමුත් ලෙජරයේ ගිවිසුම් උල්ලංඝණය කිරීමේ අරමුදල් (Bond Violation Fund) ගිණුමට බැර නොකර විලම්භිත ආදායම් (Deferred Income) ගිණුමට බැර කර ඇත. එම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) තොග ගිණුමේ ලෙජරයට අනුව ශේෂය නිවැරදිය. උපලේඛනය සකස් කිරීමට අදාළ තොරතුරු පරිගණක ගත කිරීමේ දී සිදු වූ දෝෂයක් උපලේඛනයේ වෙනසට හේතු වී ඇත.

මින් ඉදිරියට මෙවැනි අඩුපාඩු ඇති නොවන ලෙස කටයුතු කිරීමට අදාළ නිලධාරීන් දැනුම්වත් කිරීමට අධ්‍යක්ෂ (මුදල්) වෙත උපදෙස් ලබා දෙන ලදී.

(ඈ) මෙම වෙනසට හේතු වී ඇත්තේ ආයතනයේ ගිවිසුම් කඩ කිරීමට අදාළව ආයතනයේ නිලධාරියෙකු වන රසික බාලසූරිය මහතාගෙන් අයවිය යුතු රු. 3,187,465/- ක් වන මුදලයි. මෙම මුදල ලැබිය යුතු මුදලක් වන හෙයින් ලැබිය යුතු ද (Receivable) ගිණුමට හර කර ඇති නමුත් ලෙජරයේ ගිවිසුම් උල්ලංඝණය කිරීමේ අරමුදල් (Bond Violation Fund) ගිණුමට බැර නොකර විලම්භිත ආදායම් (Deferred Income) ගිණුමට බැර කර ඇත. එම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

ජාතික අධ්‍යාපන ආයතනයේ මධ්‍යම පුස්තකාලය මහල් 3 කින් යුක්ත අතර පොත් ලක්ෂ 3 ක් ඉක්මවා ඇත. පුස්තකාලයේ බැහැරදීම හා විමර්ශන සාමාජිකත්වය ලබා ඇති ආයතනයේ නිලධාරීන්, පාඨමාලා ලාභීන් මෙන්ම බාහිර අධ්‍යාපන පර්යේෂකයින් රාශියක් වෙනුවෙන් සේවා සැපයීම සඳහා දැනට පුස්තකාලයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය 4 කි. අප ආයතනය සති අන්ත පාඨමාලා සඳහා පුස්තකාලය විවෘතව තැබිය යුතුය.

2015 - 2016 වර්ෂයේ දී පොත් සමීක්ෂණයක් සිදු කළ අතර පොත් වල මිල සඳහන් කර නැත. නමුත් පොත් වල අනෙක් විස්තර (උදා : ග්‍රන්ථ නාමය, කර්තෘ, වර්ග අංකය, ISBN අංකය, පරිග්‍රහණ අංකය, පරිගණකගත අංකය, වෙනත්) ඇතුළත් උපලේඛනයක් සකස් කර ඇත.

දැනට සිදු කරන ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය යටතේ මෙම කාර්යය ඉටු කර ගැනීමට අපේක්ෂා කළ නමුත් පුස්තකාල පොත් ප්‍රත්‍යාගණනය කිරීම වත්කම් ප්‍රත්‍යාගණනය යටතේ සිදු කිරීම ප්‍රායෝගිකව කළ නොහැකි බව මෙම කාර්යයට අදාළව මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතන ප්‍රකාශ කරන ලද හෙයින් එය සිදු කර ගත නොහැකි විය.

මෙම පොත් තොගය තුළ අවස්ථා ගණනකදී මිලදී ගත් පොත් සඳහා ගෙවා ඇති මුදල් නිරූපණය වේ. අදාළ පොත් තොගයෙහි අන්තර්ගතය පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් ඉක්මණින් සකසා ඒ අනුව උපලේඛනයක් සකස් කර ගැනීමට අපේක්ෂා කෙරේ. පුස්තකාල පොත් සමීක්ෂණය සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන මුදල් හා සහාය සේවා) වෙත උපදෙස් ලබා දෙන ලදී.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**2.2 (අ) ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 1.2 වගන්තිය 6.1 වගන්තිය**

ජාතික අධ්‍යාපන ආයතනයේ සේවයේ නියුතු අතිකාල දීමනා හිමිකම් ලැබීමට අයත් කාර්ය මණ්ඩලයට අතිකාල දීමනා ගෙවීමේදී 1995.03.22 දින සහකාර කම්කරු කොමසාරිස්වරයා විසින් දෙන ලද නියෝගය මත ජීවන වියදම් දීමනාව ඇතුළත් කරමින් මාසික පාරිශ්‍රමිකය ගණනය කර පැයකට පැය 1 1/2 වශයෙන් ලැබීමට හිමිකම් සලස්වා අතිකාල ගෙවීම් කර ඇත.

එහෙත් 2016.04.25 දිනැති අංක 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 13(2) උප වගන්තිය මගින් එතෙක් අතිකාල දීමනා ගණනය කළ ක්‍රමවේදයන් අහෝසි කර ඇති අතර, එම චක්‍රලේඛයේ දක්වා ඇති විධිවිධාන පරිදි අතිකාල දීමනා ගෙවීම් සිදු කර ඇත.

එහෙත් යථෝක්ත චක්‍රලේඛයේ අතිකාල සම්බන්ධයෙන් 13 වන වගන්තියෙන් දක්වා ඇති විධිවිධාන අංක: අමප. 18/0254/719/013 හා 2018.03.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අනුමැතිය ලබා සංශෝධනයට භාජනය කර ඇත. ඒ අනුව 2018.04.11 දිනැති අංක 02/2016 (II) කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2 වගන්තිය මගින් යථෝක්ත චක්‍රලේඛය 13.2, 13.3, 13.4 යන වගන්ති ඉවත් කිරීම සිදු කර ඇති අතර, ඒ වෙනුවට 02 (1) (ආ) වගන්තිය ඇතුළත් කර ඇත. එම වගන්තිය මගින් දක්වා ඇත්තේ " ව්‍යවස්ථාපිත නීතියක් මගින් සලසා ඇති ප්‍රතිපාදන අනුව අතිකාල දීමනා ගෙවීම සම්බන්ධයෙන් කටයුතු කරන ලද ආයතන විසින් ඒ අනුව කටයුතු කළ හැකි බව දක්වා ඇත. එමෙන්ම ආයතන සංග්‍රහය තම පරිපාලන කටයුතු සඳහා යොදා ගන්නා ආයතන විසින් අතිකාල ගෙවීම ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ කර ගත යුතු බවය."

ඒ අනුව 1985 අංක 28 දරන පනතින් පිහිටුවා ඇති ජාතික අධ්‍යාපන ආයතනය පරිපාලන කටයුතු වලදී අදාළ කර ගනු ලබන්නේ ආයතන සංග්‍රහය නොවන අතර, ජාතික අධ්‍යාපන ආයතනය වෙනුවෙන් සකස් කර ඇති පරිපාලන හා මූල්‍ය සංග්‍රහය වේ. එයට අමතරව සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාර අරමුදල් සම්බන්ධයෙන් සේවක අර්ථ සාධක අරමුදල් පනත හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලද, පාරිතෝෂිත ගෙවීම් වලදී පාරිතෝෂිත පනත ද, සේව්‍ය සේවක වගකීම් වලදී මෙන්ම අතිකාල දීමනා ගෙවීමේ දී සාප්පු හා කාර්යාල සේවක පනත අදාළ කර ගනු ඇත. ඒ මත පදනම්ව කම්කරු කොමසාරිස් විසින් 1995.03.22 දින හා 2018.08.01 දින ලබා දී ඇති නියෝග අනුව අතිකාල දීමනා ගෙවීම් කර ඇත.

2/2016 (II) චක්‍රලේඛය අනුව කම්කරු කොමසාරිස්ගේ නියෝගය පරිදි අතිකාල ගෙවීම සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් ඉල්ලා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත 2019.06.18 දින ලිපියක් යොමු කර ඇත. (ඇමුණුම 01)

**(ආ) 2018 මාර්තු 19 දිනැති 01/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය**

2018 මාර්තු 19 දිනැති 01/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි වාහන විකිණීමෙන් ලද මුදල වන රු. 2,524,000/- මුදල් අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කිරීම සඳහා ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත චෙක්පතකින් යවා ඇත.

**(ඇ) භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් 2013 වර්ෂයේදී අනුමත කර ඇති අංක 257 දරන චක්‍රලේඛය**

ජාතික අධ්‍යාපන ආයතනය විසින් චක්‍රලේඛ ප්‍රකාරව පළමුව 25% දෙවනුව 50% ක් ද ගෙවීම් සීමා පැනවීම අනුමත කරවාගෙන තිබුණි. එම කාලය වන විට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ප්‍රමාණවත් පරිදි සේවයේ නියුතු වුව ද, වර්තමානයේ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සේවය කරනුයේ, අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් 55% ක් පමණි. එම අධ්‍යයන කාර්ය මණ්ඩලය

විසින් ජාතික අධ්‍යාපන ආයතනයේ වාර්ෂික සැලැස්මේ කාර්යයන් 120 ක් පමණ ඉටු කරනු ලබයි. මෙම හේතුවෙන් රාජකාරී වේලාව තුළ නියමිත අධ්‍යයන කාර්යයන් අවසන් කළ නොහැකි අතර බාහිර සම්පත් පුද්ගල සේවය ද නිරතුරුව ම ගැනීමට සිදුවේ.

2014, 2015, 2016, 2017, 2018 වර්ෂ වලදී නව විෂයමාලා චක්‍රයට අදාළව විෂයයන් 147 ක් සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, සම්පත් පොත් සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන් ම සකස් කර පද්ධතියට ලබා දීමට නියමිත විය. ඊට අමතරව,

2017 - 2021 පස් අවුරුදු සැලැස්මේ හා 2017 වාර්ෂික සැලැස්මේ නොතිබුණු 13 වසරක සහතිකකරණ ලද අධ්‍යාපන වැඩසටහන යටතේ 12, 13 ශ්‍රේණි සඳහා නවතම විෂයයන් 26 ක නව විෂය නිර්දේශ හා මොඩියුල මාධ්‍ය තුනෙන් ම අලුතින් සකස් කිරීමට සිදුවිය. මේ නිසා ආයතනයේ සිටින සීමිත අධ්‍යයන කාර්ය මණ්ඩලය ඒ සඳහා යොදවා ගැනීමට සිදු විය.

එසේම, ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වන පාඨමාලා සඳහා සම්බන්ධීකරණය සිදු කරන නිලධාරීන් හා දේශන පවත්වන ආයතන නිලධාරීන්ට සති අන්තයේ දී අනිවාර්යයෙන් පාඨමාලා වලට පැමිණීමට සිදු වේ.

උදා :- ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පාඨමාලා
මීපේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානය මඟින් පවත්වන පාඨමාලා

තව ද, ආයතනයේ කාර්යය මණ්ඩලය 2006 චක්‍රලේඛය පරිදි අධ්‍යයන කාර්යය මණ්ඩලට හිමි වැටුප්, වැටුප් පරිවර්තන සිදු වී නොතිබීම නිසා 50% ගණනය කිරීමේ දී අධ්‍යයන නිලධාරීන්ගේ මූලික වැටුප නිවැරදි නොවන බැවින් එහි අවාසිය ද අධ්‍යයන නිලධාරීන්ට බලපා ඇත.

ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්යය භාරය විශ්ව විද්‍යාලයකට සමානුපාතිකව පවතින අතර බඳවා ගැනීමේ අපහසුතා ද පවතී. එබැවින් ආයතනයට සරිලන වැටුප් ප්‍රමාණය අනුමත කර ගැනීමට ඉදිරිපත් කර ඇති නමුත් ඒ සඳහා ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ ජාතික අයවැය යෝජනාවලියට සරිලන වැටුප් ක්‍රමයක් යෝජනා කර ඇත. එය මේ දක්වා ක්‍රියාත්මක නොවීය.

මේ හේතුවෙන් ඉදිරි අධ්‍යයන කාර්යයන් වලදී සෙනසුරාදා, ඉරිදා හා නිවාඩු දිනවල ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සේවය සඳහා පැමිණීමට අකමැත්ත දක්වන අතර ඔවුන්ගේ සේවය නොමැතිව බාහිර සම්පත් පුද්ගලයින් ද සේවයට යොදවා ගත නොහැකි බැවින් ආයතනය බලවත් අර්බුදයකට මුහුණපානු ඇත.

මෙම කරුණු හේතුවෙන් මූලික වැටුපෙන් 50% උපරිම සීමාව තුළ ගණනය කිරීමේ දී ගැටළු මතු වී ඇත.

එසේ වුව ද, මුදල් දෙපාර්තමේන්තුව විසින් එක් එක් නිලධාරියා වෙතින් අයවිය යුතු මුදල් ගණනය කිරීම් සිදු කර ඇති අතර ඒ පිළිබඳ එක් එක් නිලධාරියා වෙත දැනුම් දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. නිලධාරීන්ගේ එකඟතාවය මත කොටස් වශයෙන් අය කිරීමට කටයුතු කෙරෙනු ඇත.

**2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස හා ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව**

**(අ)** මුද්‍රණාලයේ ඇති මුද්‍රණ යන්ත්‍ර වසර 30කට වඩා පැරණි ඒවාය. මේ නිසාම මෙම යන්ත්‍ර නිතර නිතර අලුත්වැඩියා කිරීමටද සිදු වේ. එබැවින් නවීන මුද්‍රණ යන්ත්‍රයක් මිල දී ගැනීමට අවශ්‍ය පිරිවිතර සකස් කර ඇගයීම් කර ප්‍රසම්පාදන අංශයට ලබා දී ඇතත් එක් ආයතනයකින් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබූ නිසා ප්‍රසම්පාදන කමිටුව එය ප්‍රතික්ෂේප කර ඇත.

ජාතික අධ්‍යාපන ආයතනයෙන් සම්පාදනය කර මුද්‍රණය සඳහා ලබාදෙන පොත් පත් සංඛ්‍යාව සීඝ්‍රව වර්ධනය වී ඇත. මුද්‍රණ යන්ත්‍ර ඉතා පැරණි නිසාත්, නිතර නිතර අලුත්වැඩියා කිරීමට සිදු වන නිසාත්, ප්‍රමාණවත් තරම් යන්ත්‍ර ක්‍රියාකරුවන් නොමැති වීම නිසාත්, රාජකාරි වේලාවෙන් පසු දැනට සිටින යන්ත්‍ර ක්‍රියාකරුවන් යොදවාගෙන කාර්යයන්ගෙන් කොටසක් නිම කිරීමට කටයුතු කර තිබුණි. ඉතිරි මුද්‍රණ කාර්යයන් බාහිර ආයතනයකට ප්‍රසම්පාදන මණ්ඩලය හරහා භාර දී ඇත.

(ආ) 2018 වර්ෂයේ විවිධ අංශ වලින් මුද්‍රණය සඳහා ඇණවුම් 243ක් ලබා දී තිබුණි. එයින් මුද්‍රණ ඇණවුම් 218ක් විවිධ බාධක මධ්‍යයේ නිම කිරීමට හැකි විය. නවීන තාක්ෂණයෙන් යුත් මුද්‍රණ යන්ත්‍ර හා පුහුණු යන්ත්‍ර ක්‍රියාකරුවන් ලබා ගැනීමට හැකිවූයේ නම් ඉතිරි මුද්‍රණ ඇණවුම් 25 ද නිම කිරීමට හැකියාව තිබුණි.
මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියාව සඳහා ගත වන කාලය, පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය නිසා මුද්‍රණය කිරීමට ලබා දුන් කාර්යයේ ස්වභාවය අනුව ගත වන කාලය වෙනස් වේ. එමනිසා සැලසුම් කළ කාලසීමාවට එම කාර්යයන් ඉටු කිරීමට නොහැකි වේ.

(ඇ) **සංයුක්ත ගණිතය**

ගණිත විෂයන්ට අදාළව ගුරු පුහුණුව පවත්වන අවස්ථාවලදී ගුරුවරුන්ට අවශ්‍ය විෂය මාලා ද්‍රව්‍ය ලබා දීමට කටයුතු කර ඇත. එබැවින් ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය ඉටු කිරීමේ දී ගැටළු සහගත තත්ත්වයක් ඇති නොවේ. මේ වන විට අදාල සියළුම ගුරු මාර්ගෝපදේශ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර ඇත.

**ජීව විද්‍යාව, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව**

ජීව විද්‍යාව විෂය නිර්දේශය 2016.12.10 දින ද රසායන විද්‍යාව විෂය නිර්දේශය 2016.12.15 දින ද භෞතික විද්‍යාව විෂය නිර්දේශය 2017.01.04 දින ද ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය විසින් නිර්දේශ කර තිබුණි.
එහෙත් අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා ශාඛාවේ ඉල්ලීම මත, මෙම සකස් කර අවසාන කළ විෂය නිර්දේශ, ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ උපදෙස් පරිදි නැවත සලකා බැලීමට සිදුවිය. ඒ සඳහා අතිරේකව මාස පහක පමණ කාලයක් ගත කිරීමට සිදු විය.
ගරු අධ්‍යාපන අමාත්‍යතුමා 2017 දෙසැම්බර් 12 දින ලබා දුන් උපදෙස් පරිදි ජීව විද්‍යාව විෂය නිර්දේශය නැවත සලකා බැලීම සිදු කල අතර එසේ නැවත සලකා බැලූ ජීව විද්‍යාව විෂය නිර්දේශයට 2018.02.06 දින ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ නිර්දේශය ලැබුණි.
මෙහි ප්‍රතිඵලයක් ලෙස ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම ප්‍රමාද විය. එසේ ප්‍රමාද වූ ගුරු මාර්ගෝපදේශ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ අනුමැතිය ලබා මුද්‍රණය කිරීම සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට 2018 මැයි මස වන විට භාර දී ඇත. මේ වන විට එම ගුරු මාර්ගෝපදේශ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර බෙදාහැරීම් සිදු කර ඇත.

(ඉ) උක්ත කාර්යයන් සඳහා අතපසුවීමකින් ලංසු සුරක්ෂණ ලබා ගැනීමට කටයුතු කර නොමැති අතර මේ වන විට එම කාර්යයන් සාර්ථකව අවසන් කර ඇත. ඉදිරි මිල ගණන් කැඳවීමේ දී ලංසු සුරක්ෂණ ලබා ගැනීමට කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) වෙත උපදෙස් ලබා දෙන ලදී.

(ඊ) ආයතනයේ තෙමහල් නේවාසිකාගාරයේ වැසිකිලි පද්ධතිය ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමේ ලිපිය 2018.11.14 දින අත්සන් තබා ඇති අතර 2018.12.21 දින කොන්ත්‍රාත්තුවට අදාළ ප්‍රදාන ලිපිය ලබා දී ඇත. 20% ක් අත්තිකාරම් මුදල වන රු. 11,251,932/05 ක මුදල 2018 වර්ෂයේ දී කොන්ත්‍රාත්කරු වෙත ලබා දී ඇත. මේ වන විට කොන්ත්‍රාත් කටයුතු සිදු කරමින් පවතින අතර 60% ක භෞතික ප්‍රගතියක් ඇත. මෙම වර්ෂය තුලදී කාර්යය අවසන් කිරීමට සැලසුම් කර ඇත.

**2.5 වෙනත් නිරීක්ෂණ**

(අ) තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම හා සම්බන්ධව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2017.07.25 සහ 2017.07.31 චක්‍රලේඛ ජාතික අධ්‍යාපන ආයතනයට නොලැබීම නිසා වැඩසටහන පිළිබඳව ආයතන කාර්යය මණ්ඩලය දැනුම්වත් වීමේ යම් ප්‍රමාදයක් සිදු වුවද ඒ පිළිබඳව විගණකාධිපතිගේ විමසුම් ලිපිය ලද පසු එම චක්‍රලේඛ සියල්ල භාගත කිරීම් සිදු කර 2018 වාර්ෂික සැලසුම් සකස් කිරීම පිළිබඳව අධ්‍යයන කාර්යය මණ්ඩලය දැනුම්වත් කරන අවස්ථාවේදී ඔවුන් සියළු දෙනා තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳව දැනුම්වත් කිරීමට කටයුතු කර ඇත. 2018 වර්ෂයේ සිට විෂයමාලා සංවර්ධන හා පුහුණු කාර්යයවලදී අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සියළු දෙනා ඒ පිළිබඳව අවධානය යොමු කර ඇත.

තිරසාර සංවර්ධන අරමුණු ඉටුකිරීමේදී ජාතික අධ්‍යාපන ආයතනයට පැවරී ඇති ප්‍රමුඛ කාර්යභාරය (විෂයමාලා සංවර්ධනය) සමීප වන්නේ " ගුණාත්මක අධ්‍යාපනය" යනුවෙන් සඳහන් වන 4 වන තිරසාර සංවර්ධන අරමුණ සමගින් පමණක් බව නිරීක්‍ෂණය වෙයි.

ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්යභාරය හා හඳුනාගත් ඉලක්ක හා ඒවා මැන බැලෙන දර්ශක 2018.07.18 දින විගණකාධිපති වෙත ලබා දෙන ලද ලිපියෙහි සඳහන් කර ඇත.

**(ආ) ගුරුමාර්ගෝපදේශ, අත්පොත් සකස් කිරීම**

| දෙපාර්තමේන්තුව | විෂයය | වර්තමාන තත්ත්වය |
|---|---|---|
| සිංහල භාෂා දෙපාර්තමේන්තුව | සිංහල දෙවන බස වැඩ පොත - 6 වන ශ්‍රේණිය | මෙම පොත ජාතික අධ්‍යාපන ආයතනයේ මුද්‍රණාලය මඟින් මුද්‍රණය කර අලෙවි කිරීම සඳහා ආයතනයේ පොත් අලෙවිසැලට යොමු කර ඇත. |
| | සිංහල - 13 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය | මෙම පොත මුද්‍රණය කර ඇති අතර එහි මුද්‍රිත පිටපත අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් 2019.03.13 දින ජාතික අධ්‍යාපන ආයතනයට ලබා දී ඇත. |
| තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව | කෘෂි විද්‍යාව පාරිභාෂික ශබ්ද මාලාව | 2019 වර්ෂයේ සැප්තැම්බර් මස පැවැත්වෙන ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය. |
| | ගෘහ ආර්ථික විද්‍යාව ප්‍රායෝගික ක්‍රියාකාරකම් සංග්‍රහය-12 ශ්‍රේණිය | 2019 වර්ෂයේ සැප්තැම්බර් මස පැවැත්වෙන ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය (සිංහල හා දෙමළ මාධ්‍ය). |
| ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව | 5 ශ්‍රේණිය විෂය නිර්දේශය | 2018 වාර්ෂික සැලැස්ම අනුව සකස් කල යුතුව තිබුණේ 5 ශ්‍රේණිය විෂය නිර්දේශයයි. එය නියමිත පරිදි සකස් කර ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ හා ආයතන සභාවේ අනුමැතිය ලබා පෙළපොත සකස් කිරීමේ කටයුතු සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට යවා ඇත. |

**සම්පත්දායක පොත් සකස් කිරීම**

| දෙපාර්තමේන්තුව | විෂයය | වර්තමාන තත්ත්වය |
|---|---|---|
| තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය 13 ශ්‍රේණිය | සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් සකස් කිරීම අවසන් කර ඇත. එම පොත් භාෂා සංස්කරණය සඳහා දැනට ඉදිරිපත් කර ඇති අතර එම පිටපත් ලැබුණු පසු එහි සංස්කරණයන් තිබුණහොත් ඒවා සකස් කිරීමෙන් අනතුරුව ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය. |
| වාණිජ දෙපාර්තමේන්තුව | ව්‍යාපාර අධ්‍යයනය බහුවරණ ප්‍රශ්න මාර්ගෝපදේශය 12 හා 13 ශ්‍රේණි | 2019.05.14 දින මුද්‍රණය සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ මුද්‍රණාලයට භාර දී ඇති අතර මේ වන විට මුද්‍රණය කරමින් පවතී. |
| ගණිත දෙපාර්තමේන්තුව | සංයුක්ත ගණිතය I ස්ථිතිකය (සි/දෙ/ඉ) | ස්ථිතිකය දෙමළ සහ ඉංග්‍රිසි මාධ්‍යය පොත් මුද්‍රණය කර ඇත. සිංහල මාධ්‍යය පොත මුද්‍රණයට භාර දී ඇත. පොත් මුද්‍රණය කිරීම් කටයුතු අවසන් වී ඇත. පොත් බැඳීමේ කටයුතු (Binding) සිදු කිරීමට නියමිතය. |
| | II ප්‍රශ්න පත්‍ර බැංකුව (සි/දෙ/ඉ) | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වල දී විෂය සංශෝධන අනුව නැවත සංස්කරණය කරන ලදී. එවකට පැවති විෂයමාලා සංශෝධන වලට ප්‍රමුඛත්වය දීම නිසාත් කාර්යය මණ්ඩල හිඟය නිසා පරිවර්තන සහ පරිගණක ගත කිරීම ප්‍රමාද විය. මේ වන විට මෙම පොත මුද්‍රණය කර බෙදා හැර ඇත. |
